Ministry of Urban Development and Housing

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

வீட்டு வசதி மற்றும் நகர்ப்புற வளர்ச்சித் துறை அமைச்சகம்

# වාර්ෂික වාර්තාව
# Annual Report
# 2023



Construction Industry Development Authority

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

கட்டுமான தொழில் மேம்பாட்டு ஆணையம்

# පටුන


**1.0 පසුබිම** 2

**2.0 විධායක සාරාංශය** 3

**3.0 සභාපතිවරයගේ පණිවුඩය** 4

**4.0 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය** 5

**5.0 CIDA හි කළමනාකරණ මණ්ඩලය - 2023** 6

**5.1 සංවිධාන ව්‍යුහය** 9

**5.2 CIDAහි ප්‍රධාන අංශ** 10

**5.2.1 කර්මාන්ත සේවා අංශය** 10

**5.2.2 කර්මාන්ත සංවර්ධන අංශය** 10

**5.2.3 කර්මාන්ත පුහුණු අංශය** 10

**5.2.4 විද්‍යුත් යාන්ත්‍රික සේවා (EMS) අංශය** 10

**5.2.5 මානව සම්පත් සහ පරිපාලන අංශය** 10

**5.2.6 මූල්‍ය අංශය** 11

**6.0 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම** 12

**6.1 කර්මාන්ත සේවා අංශය** 12

6.1.1 උපදේශන සේවාවන් 12

6.1.2 විනිශ්වයකරුවන් පත් කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයේ විනිශ්වයකරණය සඳහා පහසුකම් සැලසීම. 13

6.1.3 තාක්ෂණික විගණන සේවය 13

6.1.4 දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින්ගේ සේවය 14

6.1.5 ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල උච්ඡාවචනය වීම පිළිබඳ මාසික සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම 14

6.1.7 උත්පාදනය කළ ආදායම 15

**6.2 කර්මාන්ත සංවර්ධන අංශය** 16

6.2.1 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ යෝජනා ක්‍රමය 16

6.2.2 මාර්ගගත ලියාපදිංචිය – වැඩිදියුණු කිරීමේ යෝජනාව 17

6.2.3 ලියාපදිංචි කිරීමේ ක්මාර්ග සඳහා සහනයක් හඳුන්වාදීම 17

6.2.4 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා වන සංශෝධන 17

6.2.5 දේපළ සංවර්ධකයන් ලියාපදිංචි කිරීම 17

6.2.6 ඉදිකිරීම් ද්වාරය සහ උපාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 18

6.2.7 නිශ්චල දේපළ නියෝජිතායතන ලියාපදිංචි කිරීම 18

6.2.8 විදේශීය කොන්ත්‍රාත්කරුවන් තාවකාලික ලියාපදිංචි කිරීම 18

6.2.9 සුදුසුකම් ලත් තැනැත්තන්/සමාගම් ලියාපදිංචි කිරීම 19

6.2.10 තනි පුද්ගල විදේශ උපදේශකයින් තාවකාලිකව ලියාපදිංචි කිරීම 19

6.2.11 ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා CIDA සම්මාන 2020/2021 19

6.2.12 ඉදිකිරීම් වැඩබිම්වල ඩෙංගු වැළැක්වීමේ කාර්යයන්/නිරීක්ෂණ කාර්යයන් 20

6.2.13 තොරතුරු තාක්ෂණ (IT) ඒකකයේ කාර්ය සාධනය 20

6.2.14 සංවර්ධන අංශය විසින් උත්පාදනය කළ ආදායම 20

**6.3 කර්මාන්ත පුහුණු අංශය** 21

6.3.1 ඉදිකිරීම් අංශයේ නිපුණතා සංවර්ධනය - ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන 21

6.3.2 ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්පී හැඳුනුම්පත් නිකුත් කිරීම 21

6.3.3 RPL (පෙර ඉගෙනුම් පිළිගැනීම) වැඩසටහන 22

6.3.4 පුහුණු වැඩසටහන් 22
6.3.5 නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) 24
6.3.6 උත්පාදනය කළ ආදායම 27
**6.4 විදුත් යාන්ත්‍රික සේවා (EMS) අංශය** 28
6.4.1 CETRAC පුහුණු වැඩසටහන් 28
6.4.2 විශේෂ වැඩසටහන් 32
6.4.3 බර වාහන පුහුණු විද්‍යාලය (OTC) - වැඩසටහන් 34
6.4.4 උත්පාදනය කරන ලද ආදායම 37
**6.5 මානව සම්පත් සහ පරිපාලන අංශය 38**
6.5.1 පුරප්පාඩු පිරවීම 38
6.5.2 අභ්‍යන්තර උසස්වීම් 38
6.5.3 ස්ථිර කිරීමේ ලිපි නිකුත් කිරීම 38
6.5.4 ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් 38
6.5.5 පාරිතෝෂික ගෙවීම් 38
6.5.6 CIDA කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය කිරීම 38
6.5.7 CSR ක්‍රියාකාරකම් 39
6.5.8 කාර්ය මණ්ඩල තොරතුරු 39
6.5.9 2023 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන කාර්යයන් 41
6.5.10 පහසුකම් කුලියට දීමෙන් උපයන ලද ආදායම 41
6.5.11 උත්පාදනය කරන ලද මුළු ආදායම 41
**6.6 මූල්‍ය අංශය 42**
6.6.1 හැඳින්වීම 42
6.6.2 මූල්‍ය පහසුකම් සැපයීම 43
6.6.3 මූල්‍ය කළමනාකරණය සහ වාර්තාකරණය 43
6.6.4 උත්පාදනය කරන ලද ආදායම 43
**7.0 ඇමුණුම 1- වාර්ෂික ක්‍රියාවට නැංවීමේ සැලැස්ම -2023 44**
**8.0 මූල්‍ය ප්‍රකාශනය 53**
**9.0 විගණකාධිපතිවරයාගේ වාර්තාව 106**

**1.0 පසුබිම**

ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය මානව සම්පත් ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය (CITP) පිහිටුවීමට 1981 වර්ෂයේදී ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවට අරමුදල් සපයන ලදී. 1986 වර්ෂයේදී ස්ථාපිත කර 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1992.06.10 දිනැති අංක 718/15 දරන ගැසට් නිවේදනය මඟින් රාජ්‍ය සංස්ථාවක් ලෙස 1992 වර්ෂයේදී නැවත ස්ථාපිත කරන ලද ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD), CITP හි අනුප්‍රාප්තිකයා විය.

2014 අංක 33 (අවලංගු කිරීම් සහ අත්හැරීම්) දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (CID) පනතේ 65 වැනි වගන්තියේ (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) රාජ්‍ය සංස්ථාවක් ලෙස ස්ථාපිත කරමින් 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද 1992 ජුනි 10 දිනැති අංක 718/15 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය, ICTAD හි නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයා ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) ස්ථාපිත කරමින් 1 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නියමය මඟින් අවලංගු කරන ලදී.

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අතර ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාපටිපාටි සහ ක්‍රියාකාරකම් නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීමේ නෛතික පදනම සපයමින් 2014 දෙසැම්බර් 29 දින සිට ක්‍රියාත්මක වේ.

ඉදිකිරීම් කර්මාන්තයේ උන්නතිය උදෙසා අධිකාරිය මෙහෙයවීම, පනතේ අරමුණුවලට අනුකූලව ඉදිරියට යාම සඳහා CIDA පිහිටුවීම, කර්මාන්තයේ අරමුදල් සැපයීමේ ප්‍රතිපත්තිය ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ CIDA අරමුදල පිහිටුවීම සහ සියලු පාර්ශ්වකරුවන්, වෘත්තිකයන් සහ ශිල්පීන්ගේ සුභ සිද්ධිය සහතික කිරීම සඳහා ජාතික උපදේශක සභාවට පනතෙහි නියම කර ඇත. පාර්ශ්වකරුවන් අතර පවතින ආරවුල් සමථයකට පත් කිරීම සඳහා මැදිහත් වීම, සමථකරණය සහ විනිශ්චයකරණය වැනි ක්‍රම කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස හඳුන්වා දීම සඳහා ද එමඟින් මාර්ග විවර වේ.

CIDAහි කාර්යයන් ද 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 2 (1) උපවගන්තිය අනුව සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය සහ ඒවායේ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සමඟ එහි ප්‍රතිපත්ති අයිතම 18හි විධිවිධාන මත පදනම් වේ. විවිධ උප අංශවල එහි බලපෑමෙහි පැතිරීම, එහි මෙහෙයුම්වලට සම්බන්ධ විවිධ ක්‍රියාවලීන් සහ රාජ්‍ය අංශයට සහ පෞද්ගලික අංශයට සේවය ලබා දෙමින් එහි ක්‍රියාකාරකම්වලට සහභාගී වන බොහෝ පාර්ශ්වකරුවන් සමඟ මෙම ප්‍රතිපත්තිය ජාතික ආර්ථිකය තුළ එහි භූමිකාව ආමන්ත්‍රණය කරයි.

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ (CID පනත) විධිවිධාන මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට (CIDA) ඉදිකිරීම් කර්මාන්තයේ දියුණුවට අදාළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය විධිනියෝගය සහ අධිකාරිය සපයයි.

ඒ අනුව, පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් CIDAහි සංයුක්ත සැලැස්ම සකස් කර අවසන් කර ඇති අතර එය එක් එක් වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම්වලට නැවත බෙදා ඇත. 2023 වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම CIDA අරමුණුවල සාර්ථකත්වය සහතික කිරීම වන අතර ලේඛන දෙකම අනාගත පරපුර සඳහා වඩාත් නවීන ඉදිකිරීම් ක්ෂේත්‍රයක් සහිත පරිසර හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීමේ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

## 2.0 විධායක සාරාංශය

2023 වර්ෂයේදී සාමාන්‍ය තත්ත්වයෙන් පසු, වසංගතයෙන් දැඩි ලෙස බාධාවට පත් වූ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බොහෝ බාධාවන් සහ අභියෝගවලට මුහුණ දීමට CIDA හට සිදු විය. වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස, ඉදිකිරීම් කර්මාන්තයට ද්‍රව්‍ය ආනයන සීමා කිරීම්, ද්‍රව්‍ය හා ශ්‍රම හිඟය හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්තය පීඩනයට ලක් වූ අතර ශ්‍රී ලංකාව තුළ ඉදිකිරීම් ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම දීර්ඝ කාලයක් ප්‍රමාද වීමට හේතු විය. කෙසේ වෙතත්, 2021 වසර අවසානයේදී ආර්ථිකයන් නැවත විවෘත කිරීම, ආර්ථික ගැටලු සහ අනපේක්ෂිත අභියෝග මධ්‍යයේ වුවද ජාතික ආර්ථිකයට ඉහළ ප්‍රතිශතයක් දායක කරමින් ඉදිකිරීම් කර්මාන්තය එහි තත්ත්වය යළි ලබා ගැනීමට නියමිතය.

මේ අනුව, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස, CIDA විසින් කර්මාන්තයට සහාය වීම සඳහා 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස් කර ඇති අතර එමඟින් කර්මාන්තයේ යථා තත්ත්වයට පත්වීම අපේක්ෂා කෙරේ.

CIDA යනු වැටුප් ආදිය සඳහා සීමිත භාණ්ඩාගාර අරමුදල් සහ ඒකාබද්ධ අරමුදල් භාවිතා කරනු ලබන තමන්ගේම අරමුදල් ස්ථාපිත කිරීම මඟින් සිය වියදම් ආවරණය කරන ආයතනයක් වන අතර ලියාපදිංචිය සැපයීම, ධාරිතා ගොඩනැංවීම, ප්‍රකාශන සහ ආරවුල් විසඳීමට පහසුකම් සැපයීම මෙන්ම සාමාන්‍ය ජනතාවට සහ පෞද්ගලික අංශයට තාක්ෂණික උපදේශන සේවා සැපයීම වැනි ක්‍රියාකාරකම් මඟින් ආදායම් උපයා ගනිමින් සිය වියදම් පියවා ගනී.

CIDA ආයතනයේ මූල්‍ය ඉලක්කවලට වඩා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා දිරිගැන්වීම් සහ අභිප්‍රේරණය යන සංකල්පය ඇති පාර්ශවකරුවන් වෙත සේවා සැපයීම කරා අවධානය යොමු කර ඇත. පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේදී 2023 වර්ෂයේ වාර්ෂික ඉලක්කවලට සාපේක්ෂව 2024 වර්ෂය සඳහා වාර්ෂික ඉලක්ක වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ. මෙය ප්‍රධාන වශයෙන් වසංගත තත්ත්වයෙන් සහ අනෙකුත් ආර්ථික පසුබෑම්වලින් පසු කර්මාන්තයේ පිබිදීම හේතුවෙන් සිදු විය. මෙම පහත වැටුණු කාලසීමාව තුළ ලියාපදිංචිවීම්වල අඩුවීම කැපී පෙනෙන අතර ගෙවීම් ප්‍රමාදයන් සහ ද්‍රව්‍ය හිඟය වැනි ඉදිකිරීම් ක්ෂේත්‍රය අඛණ්ඩව පහළ යෑමේ සලකුණු අර්බුදය තවදුරටත් උග්‍ර කිරීමට හේතු වී ඇත.

CIDAහි වාර්ෂික සිදුවීමක් ලෙස, 2023 ජාතික විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ උත්සවය සංවිධානය කරන ලද අතර කොවිඩ්-19 බාධක සහ ආයතනයේ සමගාමී මූල්‍ය සීමා කිරීම් නොතකා 2023 වර්ෂයේ ඇගයීම් සඳහා වැඩපොළ චාරිකා සිදු කරන ලදී.

2023 වර්ෂය තුළදී, CIDA විසින් එහි ප්‍රධාන අරමුණක් ඉටු කිරීම සඳහා සැලකිය යුතු පිරිවිතරයන් සංඛ්‍යාවක් සමාලෝචනය කිරීමට/කෙටුම්පත් කිරීමට පියවර ගෙන ඇත. පිරිවිතර සහ මාර්ගෝපදේශ වැනි දියුණු කිරීමට එය සමත් විය.

අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව 2023 වර්ෂයේ සිටින සේවක සංඛ්‍යාව 54%ක් පමණක් වන බව නිරීක්ෂණය විය. බඳවා ගැනීම් පිළිබඳ රජයේ චක්‍රලේඛය ඉවත් කිරීමෙන් පසු CIDA සාර්ථකව මෙහෙයවීම සඳහා පුරප්පාඩු පිරවීමට නියමිතය. දැනට සිටින සේවක සංඛ්‍යාවට සාපේක්ෂව සැලකිය යුතු කාර්ය මණ්ඩල සාමාජිකයින් පිරිසක් විශ්‍රාම ගැන්වීමේ වයස සම්පූර්ණ වීම, ඉල්ලා අස්වීම ආදිය හේතුවෙන් CIDA වෙතින් ඉවත්ව ගොස් ඇත.

CIDA විසින් 2022 පරිවර්තන වර්ෂය තුළදී, කොවිඩ්-19 වසංගතය සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඒ ආශ්‍රිත ගැටලු මධ්‍යයේ වුවද, සිය රාජකාරි සහ වගකීම් උපරිම වශයෙන් අඛණ්ඩව ඉටු කරන ලදී. මෙම බාධාවන් රාජකාරියේ යෙදී සිටින කාර්ය මණ්ඩලයේ භෞතික නිරතවීම් කෙරෙහි මෙන්ම පනත මඟින් නියම කර ඇති සේවා සැපයීම හරහා මූල්‍ය ඉපැයීම් කෙරෙහි ද සාමාන්‍ය දෛනික වැඩ කටයුතු කෙරෙහි ද අහිතකර ලෙස බලපාන ලදී. CIDA දැන් සිය ඉලක්ක සහ අභිමතාර්ථ කරා ඉදිරියට යමින් සිටින අතර එමඟින් කර්මාන්තයේ පැවැත්ම සහතික කරමින් CID පනතේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් සිටී.

## 3.0 සභාපතිවරයාගේ පණිවුඩය

මෙම අනුපූරක සටහන 2023 වසරේ CIDAහි වාර්ෂික වාර්තාවට එක් කිරීමට ලැබීම මා ලද භාග්‍යයකි.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත මඟින් ඉදිකිරීම් කර්මාන්තය නියාමනය, ලියාපදිංචි කිරීම, ප්‍රමිතිකරණය සහ විධිමත් කිරීම සඳහා බලය පැවරී ඇති අතර, ආරවුල් විසඳීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමටද බලය පවරා ඇත. ඉදිකිරීම් කර්මාන්තය යනු උපතේ සිට මරණය දක්වා මිනිස් ජීවිතයට අවශ්‍ය විවිධ ආකාරයේ ඉදිකිරීම් සපයමින් යහපත් ජීවන තත්ත්වයක් සඳහා අත්‍යාවශ්‍ය සේවාවක් වන බැවින් CIDA සේවාව රට පුරා ව්‍යාප්ත වී ඇත.

කෙසේ වෙතත්, 2023 වසර 2022 වසරේ සිට සංක්‍රාන්ති වසරක් ලෙස වාර්තා වන අතර එය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ අංශ කෙරෙහි බලපෑ මූල්‍ය අර්බුදය හේතුවෙන් 2021 සිට අඛණ්ඩව පැවති අවදානම් සහ ගැටලු රැසකට මුහුණ දුන් තීරණාත්මක හා අභියෝගාත්මක වසරක් විය.

මේ අනුව, නැවත නැගී සිටීම සඳහා ඵලදායී හා කාර්යක්ෂම විසඳුම් ලබා දීමට සහ එමඟින් CID පනතේ විධිවිධාන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා CIDA විසින් මෙම අභියෝග ජය ගැනීමට උපාය මාර්ගික ප්‍රවේශයක් ගෙන ඇත. මෙම ප්‍රවේශය මහජනතාවට බොහෝ ප්‍රතිලාභ ගෙන දුන්නේය. එය මහජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සහතික කරමින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඍජු හා වක්‍ර සේවකයින්ට ද උපකාරී විය.

CIDA විසින් දරන ලද ප්‍රයත්නයන් කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට සහ ගනුදෙනුකරුවන්ට සහය වෙමින් භෞතික හා මූල්‍ය ඉලක්කවල ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරමින් සාර්ථක වූ බව CIDA සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වී ඇත. මෙම අභියෝගාත්මක වසර තුළ ඉදිකිරීම් කර්මාන්තයේ අවශ්‍ය ප්‍රත්‍යාස්ථභාවය ගොඩනැගීම සඳහා CIDA සිය ප්‍රතිරූපය සහ කාර්ය සාධනය හොඳම සේවා මට්ටමේ රඳවාගෙන ඇති බව වාර්තා කිරීමට හැකි වීම පිළිබඳව මම සතුටු වෙමි.

මෙම අභියෝග ධනාත්මකව භාරගත් සහ සියලු කාර්යයක් ප්‍රමාද නොකර ඉතා ක්‍රියාශීලී සහ ධෛර්ය සම්පන්නව ඉටු කළ සහ CIDAහි වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2023 හි සඳහන් ක්‍රියාවන්, ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කළ, CIDA කාර්ය මණ්ඩලයට මම ස්තුතිවන්ත වෙමි.

CIDA ආයතනයේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි ප්‍රර්ථනා කරමි.

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

## 4.0 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාවට මෙම ප්‍රකාශය යැවීමට ලැබීම මහත් සතුටට කරුණකි. 2023 වසර, කොවිඩ්-19 හි අයහපත් බලපෑම සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අත්විඳින ලද අභියෝග සහ අවදානම් රැසකට මුහුණ දී අභිමතාර්ථ ජයග්‍රහණය කළ සහ විශිෂ්ට සාර්ථකත්වයේ වසරක් ලෙස මම දකිමි.

මෙම වසරේදී ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සහතික කරමින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය යළි ගොඩගැනීම සඳහා සුවිශේෂී මුලපිරීම් දියත් කිරීමටත්, ජාතික ඉලක්ක කරා සංවර්ධන ගම්‍යතාවය පවත්වාගෙන යාමටත් CIDA සමත් විය.

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධානවලට සහාය දැක්වීමෙන් සහ ක්‍රියාවට නැංවීමෙන් කර්මාන්තය නැවත නගා සිටුවීම සඳහා අධිකාරියේ බොහෝ ක්‍රියාකාරකම් උපාය මාර්ගික ප්‍රවේශයකින් අඛණ්ඩව සිදු කරන ලදී.

කර්මාන්තයට සහායක් ලෙස, මෙම වසරේ මුල් භාගයේදී CIDA විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ඇගයීම් නිර්ණායකවල ලිහිල් කිරීමේ යාන්ත්‍රණයක් පනවන ලදී. ද්‍රව්‍ය සැපයුම්කරු ලියාපදිංචි කිරීම සහ දේපළ සංවර්ධකයන් ලියාපදිංචි කිරීම CIDA හට සිය නියාමන බලතල පවත්වා ගැනීමට උපකාර වූ අනෙකුත් කර්මාන්ත විධිමත් කිරීමේ මුලපිරීම් වේ.

තවද, CID පනතේ කාර්යයන්වල ගුණාත්මකභාවය සහතික කරමින්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශන ප්‍රතිශෝධනය කිරීම, පුහුණු ශිල්පීන් පුහුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සහ පුහුණු මොඩියුල සකස් කිරීම, මධ්‍යම මට්ටමේ අධීක්ෂකවරුන් සහ තාක්ෂණික ශිල්පීන් ඇතුළු කර්මාන්ත පාර්ශ්වකරුවන් සඳහා ධාරිතාවය ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ බොහෝ කාලයක් සාකච්ඡා කිරීමෙන් පසු සම්මත ලංසු ලේඛන 102 සහ 104 ප්‍රකාශන සකස් කිරීම අවසන් කර නිකුත් කිරීමට අප සමත් වී ඇත. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ පාර්ශ්වකරුවන් සමඟ බොහෝ සංවාද පැවැත්වීමෙන් පසු අවසන් කෙටුම්පත සකස් කිරීම සඳහා අදහස් එක් රැස් කර ගන්නා ලදී.

මුහුණ දීමට සිදු වූ අභියෝග සහ අවදානම් නොසලකා 2023 වසරේ නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කැපවීම සහ නොපසුබස්නා උත්සාහය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ප්‍රශංසාව පිරිනමමි. අපගේ සියලු උත්සාහයන් සඳහා නිරන්තරයෙන් ලබා දුන් අඛණ්ඩ සහයෝගය සහ මගපෙන්වීම සඳහා සභාපති, ඉංජි. ආර්.එච්. රුවිනිස් මහතාට මාගේ ස්තූතිය පිරිනමමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

## 5.0 CIDA හි කළමනාකරණ මණ්ඩලය - 2023

| | |
|---|---|
| ඉංජි. ආර්.එච්. රුවිනිස් මහතා<br>සභාපති- CIDA,<br>ඉදිකිරීම් කර්මාන්තය නියෝජනය කරමින් |  |
| ඩබ්ලිව් ඒ ට්‍රෙවින් ප්‍රනාන්දු මහතා<br>ක්‍රියාකාරී අධ්‍යක්ෂ - CIDA<br>ඉදිකිරීම් කර්මාන්තය නියෝජනය කිරීම |  |
| ඩබ්ලිව් එම් ආනන්ද මහතා<br>අතිරේක ලේකම් (නිවාස හා ඉදිකිරීම්),<br>නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය නියෝජනය කරමින් |  |
| එන් ඒ එච් කේ විජේරත්න මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>නියෝජනය කරමින් – භාණ්ඩාගාර සාමාජික |  |
| චිත්‍රා වෙඩික්කාර මිය<br>සම්මානිත මහාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය -SLIA නියෝජනය කරමින් |  |
| වරලත් ප්‍රමාණ සමීක්ෂක උපුල් ශාන්ත මහතා<br>ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය- IQSSL නියෝජනය කරමින් |  |

| | |
|---|---|
| ඉංජි. එම් ජී හේමචන්ද්‍ර මහතා<br>ජ්‍යෝෂ්ඨ විශේෂඥ, ණය ව්‍යාපෘති ප්‍රධානි<br>ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය - IESL නියෝජනය කරමින් |  |
| ඉංජි. ඩී විජේවර්ධන මිය<br>ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය- ACESL නියෝජනය කරමින් |  |
| ගෘහ නිර්මාණ ශිල්පී ජයන්ත පෙරේරා<br>සභාපති, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය- CCISL / සභාපති, ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාව- GBCSL |  |
| ඉංජි. ආචාර්ය හද්‍රානි තෝරදෙණිය මිය<br>ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරුවන්ගේ ආයතනය- IIESL නියෝජනය කරමින් |  |
| එම් ඩී පෝල් මහතා<br>සභාපති - ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය |  |
| එස් එන් බී ඒ කේ එම් නාමරත්න මිය<br>අතිරේක ලේකම් - නාගරික සංවර්ධන සහ පරිසර ආරක්ෂණ |  |

Construction Industry Development Authority
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
கட்டுமான தொழில் மேம்பாட்டு ஆணையம்



# Our Vision & Mission

## Mission

To provide strategic leadership to the construction industry, by ensuring dynamic and professional industry services through a national construction policy, regulations, capacity building, development and the promotion of quality standards of the domestic construction industry to meet the requirements for sustainable national development.

## Vision

A reliable and competent construction industry in Sri Lanka, in par with global standards



**5.1 සංවිධාන ව්‍යුහය**


Organizational Structure
Construction Industry Development Authority
(CIDA)
National Advisory Council
Chairman,
(Vice Chairman Cum Working Director,
&
Board of Management
(BOM)
Director General
AD/DD (IA)
(01)
Director (HR & Administration
AD/DD (HR & A)
(01)
Director (EMS)
AD/DD (IS)
(01)
AD/DD (CEM)
(01)
AD/DD (CEMT)
(01)
AD/DD (TEC)
(01)
AD/DD (CEOT)
(01)
AD/DD (CET)
(01)
Director (Finance)
AD/DD (Payments)
(01)
AD/DD (Finance)
(01)
Legal Officer & Board secretary
(01)
Director (Industry Services)
AD/DD (Technical Audit)
(01)
AD/DD (Dispute Resolution)
(01)
AD/DD (Advisory Services)
(02)
AD/DD (Cons. Economics)
(01)
AD/DD (SBD's Registration)
(01)
Director (Industrial Training)
AD/DD (Craft Training ASST.)
(01)
AD/DD (Craft Training)
(01)
AD/DD (Res. & Dev.)
(01)
AD/DD (MGT. & ST)
(01)
AD/DD (CHPB)
(01)
Director (Development)
AD/DD (R&M) C/C (01)
AD/DD (R&M) PD/MS (01)
AD/DD ID (02)
AD/DD (T&R)
(01)
AD/DD (IT)
(01)
AD/DD (TD)
(01)
D General
HM Level
MM Level
Legend
DD - Deputy Director
AD - Assistant Director
C/C - Construction Contractor
R&M - Registration Monitoring
PD - Property Developer
MS - Material Supply
ID - Industry Development
T&R - Technical & Reserch
IT - Information technology
TD - Technology Development
EMS - Electro mechanical Services
IS - Industrial Services
CEM - Construction Equipment Management
CEMT - Construction Equipment Mantanance Training
TEC - Tecnical
CEOT - Construction Equipment Operator Training
CET - Construction Equipment Training
IA - Internal Audit

## 5.2 CIDAහි ප්‍රධාන අංශ

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) පහත සඳහන් පරිදි මෙහෙයුම් අංශ හතරක් සහ ආධාරක අංශ දෙකක් හරහා සිය කාර්යයන් සිදු කරන අතර සෑම අංශයකම භාරකරුවෙකු ලෙස අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කටයුතු කරයි.

### 5.2.1 කර්මාන්ත සේවා අංශය

කර්මාන්ත සේවා අංශය ප්‍රමිති සැකසීම, උපදේශන සේවා සැපයීම, ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රියා පටිපාටි සඳහා පහසුකම් සැලසීම, ඉදිකිරීම් ආර්ථික විද්‍යාව පිළිබඳ තාක්ෂණික විගණන සහ පර්යේෂණ පැවැත්වීම සහ හඳුනාගත් ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයට පහසුකම් සැලසීම සහ නියාමනය කිරීම සිදු කරයි.

### 5.2.2 කර්මාන්ත සංවර්ධන අංශය

ලියාපදිංචිය, අධීක්ෂණය සහ ප්‍රතිලාභ ලබා දීමේ යාන්ත්‍රණයන් යොදා ගනිමින් කර්මාන්තය දියුණු කිරීම මෙම අංශයේ ඉලක්කය වේ. එවැනි ක්‍රියාමාර්ග මඟින් පාර්ශ්වකරුවන්ට ගුණාත්මක අවසන් නිෂ්පාදන ලබාදීමට සහ ඵලදායිතාව අත්කර ගැනීමටත්, කාලෝචිත ලෙස බෙදාහැරීම සහතික කිරීමටත්, එමඟින් කර්මාන්තයේ සේවාදායකයන්ට මුදලට සරිලන වටිනාකමක් ලබා දීමටත් පාර්ශ්වකරුවන් වැඩිදියුණු කරනු ඇත. පාර්ශ්වකරුවන්ට එරෙහිව පැමිණිලි ලැබුණු විට විනය කටයුතුවලට පෙනී සිටීම, ආවේක්ෂණ මෙහෙයුම් සිදු කිරීම ද මෙම අංශයේ විෂය පථය යටතට ගැනේ.

### 5.2.3 කර්මාන්ත පුහුණු අංශය

කර්මාන්තයේ වර්තමාන සහ අනාගත මානව ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සහ මානව ප්‍රාග්ධනයේ වර්තමාන නිපුණතා මට්ටම් ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම, කර්මාන්තයට නවකයින් පුහුණු කිරීම, නවීන තාක්ෂණික දියුණුව යොදා ගැනීම සහ මානව ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම සහ රඳවා තබා ගැනීම සඳහා කර්මාන්තයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. කර්මාන්තයේ නවීන තාක්ෂණික දියුණුව පිළිබඳව දැනුම්වත්ව සිටීම සඳහා නිපුණතා සහ දැනුම අඛණ්ඩව වැඩිදියුණු කිරීම අවශ්‍ය බැවින් අඛණ්ඩ සංවර්ධන වැඩසටහන් දිරිමත් කිරීම සිදු කරන අතර කාර්මික පුහුණු අංශය සහ නිවාස සැලසුම් සහ ගොඩනැඟිලි මධ්‍යස්ථානය මෙම අභිමතාර්ථය මත කටයුතු කරනු ලැබේ.

### 5.2.4 විද්‍යුත් යාන්ත්‍රික සේවා (EMS) අංශය

EMS අංශය විසින් ඉදිකිරීම් උපකරණ නියාමනය, අධීක්ෂණය, ධාරිතාවය ගොඩනැඟීම සහ ඉදිකිරීම් උපකරණ සහ යන්ත්‍ර සූත්‍රවල උපදේශන සේවා යන ක්ෂේත්‍ර ඔස්සේ ඉදිකිරීම් කර්මාන්තයට සේවා සපයයි. මෙම අංශය කර්මාන්ත සහාය, ඉදිකිරීම් උපකරණ පුහුණු කිරීම සහ ඉදිකිරීම් උපකරණ කළමනාකරණය යන උප අංශ තුනකින් සමන්විත වේ. මෙම අංශය ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය සහ ක්‍රියාකරු පුහුණු විද්‍යාලය යන කොටස් දෙකකින් සමන්විත වේ.

### 5.2.5 මානව සම්පත් සහ පරිපාලන අංශය

මානව සම්පත් අවශ්‍යතා සැලසුම් කිරීම, ධාරිතා ගොඩනැඟීම, කාර්ය සාධන ඇගයීමට පහසුකම් සැලසීම, ප්‍රතිලාභ කළමනාකරණය සහ CIDAහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කරමින් වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ සංයුක්ත සැලැස්ම අනුව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් අංශ සමඟ

එක්ව ආයතනයේ මානව සම්පත් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂිත වැඩ පරිසරයක් සහතික කිරීම මානව සම්පත් හා පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

**5.2.6 මූල්‍ය අංශය**

මාසික සහ වාර්ෂික ගිණුම් සකස් කිරීම, වාර්ෂික අයවැය, රජයේ බදු ඇතුළු කාර්ය මණ්ඩල සහ අනෙකුත් ගෙවීම්, රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය සහ තොරතුරු වාර්තා කළමනාකරණය කිරීම මූල්‍ය අංශයේ මූලික කාර්යයන් වේ. ඒ අනුව අයවැයට සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට අනුකූල වන අනුමත වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමේ වගකීම මූල්‍ය අංශයට පැවරේ.

# 6.0 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

## 6.1 කර්මාන්ත සේවා අංශය

කර්මාන්ත සේවා අංශය CIDA හි තාක්ෂණික අංශ තුනෙන් එකකි. කාර්මික සේවා අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලී සිටින CIDA පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීමයි. පහත දැ සඳහා පහසුකම් සැපයීම සේවාවන්හි ප්‍රධාන විෂය පථය ලෙස සැලකේ:

1. විකල්ප ආරවුල් විසඳීම
2. පාර්ශ්වකරුවන් විසින් භාවිතා කළ යුතු ප්‍රමිතීන් සැපයීම.
3. පාර්ශ්වකරුවන්ට උපදෙස් ලබා දීම.
4. ඉදිකිරීම් කර්මාන්තය සඳහා පිරිවිතර සහ ප්‍රමිතීන් සමාලෝචනය කිරීම සහ සකස් කිරීම

තාක්ෂණික හා ප්‍රසම්පාදන ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම, විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රියා පටිපාටි සඳහා පහසුකම් සැලසීම ද මෙම අංශය යටතේ ගැනෙන ප්‍රාධාන කාර්යයන් වේ. ලියාපදිංචි විනිශ්චයකරුවන්ගේ සංචිතය හරහා බේරුම්කරණය, සමථකරණය සහ විනිශ්චයකරණය වැනි ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් සඳහා වේදිකාවක් ලබා දීමෙන් පාර්ශ්වකරුවන්ට පහසුකම් සැලසීම මෙම අංශයේ විෂය පථය යටතේ පවතී.

තිරසාරභාවය සහ කාර්ය සාධනය ආමන්ත්‍රණය කරන අතරම ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල උච්චාවචනයන් කළමනාකරණය කරමින් යහ භාවිතයන් හඳුන්වා දීමෙන් ජාතික ඉදිකිරීම් ආර්ථිකයට නැංවීමට කටයුතු කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කෙරේ.

### 6.1.1 උපදේශන සේවාවන්

මෙම අංශය ලංසු ලියකියවිලි සකස් කිරීම, කොන්ත්‍රාත් පරිපාලනය, ආරවුල් බේරුම් කිරීම, CIDA සූත්‍ර ක්‍රමය සහ CIDA සම්මත ලංසු ලේඛන, තාක්ෂණික ප්‍රමිති, තාක්ෂණික පිරිවිතර සහ මාර්ගෝපදේශ ආදිය පිළිබඳ උපදේශන සේවා සපයයි. කොන්ත්‍රාත් ලියකියවිලි, ගෙවීම් සහ කොන්ත්‍රාත් පරිපාලනයට අදාළ ගිවිසුම්ගත ආරවුල්වලට මුහුණ දෙන කොන්ත්‍රාත්කරුවන් මෙන්ම රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් මෙම අංශයෙන් වාචික සහ ලිඛිතව උපදෙස් ලබා ගෙන ඇත. 2023 වර්ෂයේදී ඉහත සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් CIDA ප්‍රධාන කාර්යාලය විසින් උපදේශන සේවා 724ක් ලබා දී ඇත.

#### 6.1.1.1 ඉදිකිරීම් ආරවුල් විසඳීම ජංගම සායනය සහ ශිල්පී හැඳුනුම්පත් පිළිබඳව දැනුම්වත් කිරීම

2023 දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් කොළඹ, ගාල්ල, කළුතර සහ පුත්තලම ලෙස දිස්ත්‍රික්ක 04ක කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් සඳහා ඉදිකිරීම් ආරවුල් විසඳීමේ සායනය නොමිලේ පවත්වන ලදී. මෙම ආරවුල් විසඳීමේ සායනවලදී පාර්ශ්වකරුවන්ගේ තනි පුද්ගල පදනමින් මතු කරන ලද ආරවුල් විසඳීමට CIDA හි විනිශ්චයකරුවන්ගේ සංචිතයේ විනිශ්චයකරුවන් සම්බන්ධ විය.

| දිස්ත්‍රික්කය | කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 49 |
| ගාල්ල | 34 |
| කළුතර | 25 |
| පුත්තලම | 56 |

6.1.1 වගුව: කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව





### 6.1.2 විනිශ්චයකරුවන් පත් කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයේ විනිශ්චයකරණය සඳහා පහසුකම් සැලසීම.

අධිකාරිය විසින් සම්පාදනය කර ඇති නීතිරීති මඟින් තීරණය කළ හැකි ආකෘතියකින් සහ ආකාරයෙන් ඕනෑම ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයක් සම්බන්ධ ආරවුල් විනිශ්චය කිරීමට හැකියාව ඇති විනිශ්චයකරුවන්ගේ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතුය. විනිශ්චයකරුවන්ගේ ලේඛනය CIDA වෙබ් අඩවියේ පළ කර ඇත.

2018 දී ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය මත පදනම්ව, CIDA විසින් විනිශ්චයකරුවන්ගේ සංචිතයක් පවත්වාගෙන යා යුතුය. 2023 වර්ෂය සඳහා අධිකාරිය විසින් විනිශ්චයකාරවරුන් 50ක් ලියාපදිංචි කර ඇති අතර පැන නගින ලද ආරවුල් විසඳීම සඳහා 2023 වර්ෂය තුළ විනිශ්චයකාර පත්වීම් 26ක් සිදු කර ඇත.

| විෂය | විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව |
|---|---|
| සිවිල් | 40 |
| විදුලි | 01 |
| ප්‍රමාණ සමීක්ෂණ | 06 |
| ගෘහ නිර්මාණ ශිල්පී | 02 |
| ව්‍යුහාත්මක | 01 |
| **එකතුව** | **50** |

6.1.2 වගුව: විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව

### 6.1.3 තාක්ෂණික විගණන සේවය

තාක්ෂණික විගණනය යනු ඉදිකිරීම් ක්‍රියාවලිය සහ කළමනාකරණ ක්‍රියාවලිය මෙන්ම අවසාන නිෂ්පාදනය සහ කොන්ත්‍රාත් ලේඛන සහ කොන්ත්‍රාත් සඳහා සිදු කිරීමට ඉල්ලා සිටින ගෙවීම්වලට අදාළ ලියකියවිලි පරීක්ෂා කිරීම ඇතුළත් හඳුනාගත් ඉදිකිරීම් කාර්යයන් පරීක්ෂා කිරීමයි.

ඉදිකිරීම් පිළිබඳව පාරිභෝගික තෘප්තිය සහතික කරමින් කවර හෝ "හඳුනාගත් ඉදිකිරීම් කාර්යයක" ගුණාත්මක මට්ටම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික විගණනය හඳුන්වා දෙනු ලැබිය. අධිකාරියේ ලියාපදිංචි වී ඇති තත්ත්ව කළමනාකරණ විගණකවරුන් විසින් විගණනය සිදු කරනු ලැබේ. 2023 වර්ෂයේදී තත්ත්ව කළමනාකරණ විගණකවරුන් 06 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

| විෂය | තාක්ෂණ විගණන සංඛ්‍යාව |
|---|---|
| සිවිල් / ව්‍යුහාත්මක | 03 |
| සිවිල්/ ජල කළමනාකරණ | 01 |
| විදුලි / ගොඩනැගිලි සේවා | 02 |
| **එකතුව** | **06** |

6.1.3 වගුව: තාක්ෂණ විගණන සංඛ්‍යාව

### 6.1.4 දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින්ගේ සේවය

දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් CIDA ලියාපදිංචි කිරීම (C7 මට්ටමට පහළ ලියාපදිංචි කිරීමේ, අලුත් කිරීම, ශ්‍රේණිගත කිරීම), වැඩපොළ පරිශ්‍ර චාරිකා (ඩෙංගු පිළිබඳව දැනුම්වත් කිරීම, විශාල ව්‍යාපෘති චාරිකා ආදිය), උපදේශන සේවා, සම්මන්ත්‍රණ පැවැත්වීම, ශිල්පීන් ලියාපදිංචි කිරීම (NCASL සහ DS කාර්යාල චාරිකා), ශිල්පී කොන්ත්‍රාත් මොඩියුල/ නිපුණතා සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් කමිටු රැස්වීම සඳහා CIDA නියෝජිතයන් ලෙස සහභාගි වීම, ප්‍රධාන කාර්යාලයෙන් පවරනු ලබන හදිසි කාර්යාල වැඩ සහ විශේෂ රාජකාරි සඳහා මාර්ගගතව හරහා ප්‍රතිචාර දැක්වීම (හරිත ද්‍රව්‍ය සමීක්ෂණය, මාර්ග සමීක්ෂණය, ඉදිකිරීම් සහ කඩා ඉවත් කළ අපද්‍රව්‍ය කළමනාකරණ සමීක්ෂණය, සඟරා දත්ත රැස් කිරීම, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය පිළිබඳ සමීක්ෂණය ආදිය..) ආදියෙහි නිරත වේ.

CIDA හි ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිලධාරින් (DCOs) දිස්ත්‍රික්ක 14ක ස්ථානගත කර ඇත.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් විසින් පහත සඳහන් දෑ සඳහා පහසුකම් සපයනු ලැබේ:

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් විසින් C7ට ඉහළ කාණ්ඩ සඳහා 2023 වර්ෂයේදී නව ලියාපදිංචි කිරීම් 142ක් සහ අලුත් කිරීම්/දීර්ඝ කිරීම්/ශ්‍රේණිගත කිරීම් 2023ක් සිදු කර ඇති අතර එමඟින් පිළිවෙළින් රු. 3,559,949.43ක සහ රු. 56,498,829.13ක ආදායමක් උපයා ගෙන ඇත.

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් විසින් දිස්ත්‍රික් මට්ටමින් ආමන්ත්‍රණය කළ හැකි උපදේශන සේවා සිදු කරනු ලබන අතර 2023 වර්ෂයේදී දිවයින පුරා උපදේශන සේවා 3,846ක් සිදු කර ඇත.

- ඉදිකිරීම් කර්මාන්තයේ මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිකිරීම් සේවකයින් සඳහා වෘත්තීය ගමන් මඟක් සංවර්ධනය කිරීමට පහසුකම් සලසන "ශ්‍රම සිකුරු" නිපුණතා සංවර්ධන වැඩසටහන. 2023 වර්ෂයේදී ලියාපදිංචි කිරීම්/පුහුණු කාර්යයන්/ඇගයීම් සඳහා වන චාරිකා 395ක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් විසින් සිදු කර ඇත.

### 6.1.5 ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල උච්ඡාවචනය වීම පිළිබඳ මාසික සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම

උච්චාවචනය වන ඉදිකිරීම් මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම සඳහා සේවාදායකයන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට සහය දැක්වීමක් ලෙස, CIDA විසින් මිල දර්ශක ඇතුළත් මාසික මිල ප්‍රකාශනයක් ප්‍රකාශයට පත් කරයි.

1990 පාදක වර්ෂය කර ගනිමින් CIDA විසින් 1990 වර්ෂයේදී මිල සහ පිරිවැය දර්ශක පිළිබඳ සඟරාවක් හඳුන්වා දෙන ලදී. ද්‍රව්‍ය, ශ්‍රමය සහ ඉන්ධන වැනි ඉදිකිරීම් යෙදවුම්වල උද්ධමනය පිළිබඳ දර්ශක ලෙස දර්ශක අර්ථ දැක්විය හැක. මේ වනවිට, ද්‍රව්‍ය 55ක් (M-දර්ශක), ශ්‍රමය (L-දර්ශක) 03ක් සහ පිරියත සහ උපකරණ සඳහා මෙහෙයුම්කරු රහිත කුලී අනුපාත 03ක් (P-දර්ශක) ඇතුළුව අයිතම 61ක මිල දර්ශක ප්‍රකාශයට පත් කර ඇත. "සියලු නිවාස" (නවීන නිවාස සහ අර්ධ ස්ථිර නිවාසවල සාමාන්‍යය), "නේවාසික නොවන ගොඩනැගිලි", "සියලු සිවිල් වැඩ" (සුළු හා ප්‍රධාන වාරිමාර්ග සාමාන්‍යය, මාර්ග වැඩ, ජල සම්පාදන හා ජලාපවහන ඇතුළුව අනෙකුත් සිවිල් වැඩ) සහ "සියලු ඉදිකිරීම්" (ප්‍රධාන වර්ග 03 ක සාමාන්‍යය) ඇතුළුව විවිධ වර්ගයේ ඉදිකිරීම් කාර්යයන් කාර්තුමය වශයෙන් ගණනය කෙරේ. නවීන නිවාස, නේවාසික නොවන ගොඩනැගිලි සහ ජල සම්පාදන හා ජලාපවහන ඇතුළු පිරිවැය දර්ශක ද මාසික විචල්‍යයන් භාවිතයෙන් ප්‍රකාශයට පත් කෙරේ. නියමිත ස්ථානවලින් සහ සැපයුම්කරුවන්ගෙන් එකතු කර ගන්නා විස්තර සමඟ මාසිකව යාවත්කාලීන කෙරෙන, මාර්ගගත දත්ත රැස් කිරීමේ ක්‍රමයක් ද ඉතා ඉක්මනින් හඳුන්වා දීමට සැලසුම් කර ඇත.

මෙම සඟරාව 2023 සෑම මාසයකම අඛණ්ඩව ප්‍රකාශයට පත් කර ඇත. සඟරාවේ නිරවද්‍යතාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ සමාලෝචනය සහ අදහස් ලබා ගැනීම සඳහා පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් පවත්වන ලදී. තවද, CIDA සඟරාවෙහි හිඩැස් හඳුනාගැනීමේදී ද්‍රව්‍ය සහ සංරචක සඳහා CIDA දර්ශක නොමැතිවීම පිළිබඳ ගැටලුව අධ්‍යනය කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී.

### 6.1.6 ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය ප්‍රමිතිගත කිරීම සඳහා හඳුනාගත් ඉදිකිරීම් කාර්යයන් සඳහා අවශ්‍ය පිරිවිතර, සම්මත ලේඛන, ජර්නල සංශෝධනය සකස් කිරීම සහ සංශෝධනය කිරීම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව, "කවර හෝ හඳුනාගත් ඉදිකිරීම් කාර්යයක් සඳහා සුදුසුකම් ලත් පුද්ගලයකු උපදේශකයකු හෝ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු ලෙස සම්බන්ධ කර ගන්නා ඕනෑම පාර්ශ්වයක් ඒ සඳහා අධිකාරිය විසින් නිශ්චිතව දක්වා ඇති සම්මත ලේඛන භාවිත කළ යුතුය". ප්‍රධාන කොන්ත්‍රාත්තු සඳහා CIDA/SBD 02 (ව්‍යාපෘති ධාරිතාවය ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 කට වඩා වැඩි) සහ නිර්මාණ සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා CIDA/SBD 04 2019 නොවැම්බර් මාසයේදී සංශෝධනය කර, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ (NPC) අනුමැතියට යවා ඇත. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හේතුවෙන් NPC විසුරුවා හරින ලද අතර, පසුව 2021 ජූලි 27 වන දින භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කිරීමට කැමැත්ත ලබා දුන් අතර SBD දෙකම 2023 පෙබරවාරි සිට බලපැවැත්වෙන වසරක කාලයක් සඳහා ප්‍රධාන කොන්ත්‍රාත් සඳහා CIDA SBD/102 සහ සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා CIDA/SBD/104 ලෙස පරීක්ෂණ සංස්කරණයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 2024 අප්‍රේල් මාසය අවසානයේදී පරීක්ෂණ කාලසීමාව අවසන් වනවිට අවශ්‍ය අමතර එකතු කිරීම් සිදු කිරීමට සහ SBD/04 හි පැරණි සංස්කරණය අවලංගු කිරීමට නියමිතව ඇත. CIDA SBD 03 සහ 01 හි සංශෝධන 2024 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

2023 වර්ෂයේදී, CIDA විසින් ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියට අනුකූලව C & D අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශය සහ හරිත ද්‍රව්‍ය ශ්‍රේණිගත කිරීමේ මාර්ගෝපදේශය වැනි ප්‍රකාශන කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලදී. වැදගත් ලේඛනවලින් එකක් වන වාරිමාර්ග සහ ඉඩම් ජලාප්‍රවහන සඳහා පිරිවිතර සංශෝධනය කිරීම ආරම්භ කරන ලදී. කාලීන කර්මාන්ත අවශ්‍යතාවයක් වන උපදේශන සේවා සඳහා යෝජනාවක් සඳහා වන ඉල්ලීමක් සඳහා සම්මත ලේඛනයක් ආරම්භ කර පළමු කෙටුම්පත සම්පූර්ණ කරන ලදී. ඉදිකිරීම් කර්මාන්තයේ ජලරෝධක කාර්යයන් සඳහා පිරිවිතරයක් අවසන් කරන ලදී. CIDA විසින් මාර්ගෝපදේශ ඇතුළුව ප්‍රකාශන අන්තර්ජාලය හරහා විකිණීම සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම මුලපිරීම CIDA සම්පත් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කරන අතර ඩිජිටල් නියැලීම ප්‍රවර්ධනය කරයි.

### 6.1.7 උත්පාදනය කළ ආදායම

කර්මාන්ත සේවා අංශය මඟින් 2023 වර්ෂයේ උපයා ඇති ආදායම රු. 8,359,866.00 කි.

| අයිතමය | ආදායම (රු.) |
|---|---|
| විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීමේ/අලුත් කිරීමේ ගාස්තුව | 790,000.00 |
| තත්ත්ව කළමනාකරණ විගණකවරුන්ගේ අලුත් කිරීමේ ගාස්තුව | 35,000.00 |
| තාක්ෂණික විගණනය | 10,000.00 |
| උපදේශන සේවා සැපයීම | 359,375.00 |
| ප්‍රකාශන විකිණීම | 3,622,000.00 |
| විනිශ්චයකරුවන් පත් කිරීමේ ගාස්තුව | 1,535,000.00 |
| සම්මන්ත්‍රණ | 1,069,000.00 |

6.1.4 වගුව : උත්පාදනය කළ ආදායම

## 6.2 කර්මාන්ත සංවර්ධන අංශය

### 6.2.1 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ යෝජනා ක්‍රමය

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (CCR) කොන්ත්‍රාත්කරුවන්ගේ ශක්තිමත් කාර්ය සාධනය සහතික කරන පූර්ව සුදුසුකමකි. මෙම අවශ්‍යතාවය 2014 අංක 33 දරන CID පනතේ 34 වැනි වගන්තියේ දක්වා ඇත. පසුව ක්‍රියාවලිය නිර්දේශ කරමින් අංක 2057/5 ගැසට් පත්‍රයක් නිකුත් කර ඇත. තවද, ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී නිර්ණායකයක් ලෙස සලකා බැලීම සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2006 මඟින් මෙම ලියාපදිංචිය ශක්තිමත් කර ඇත.

CIDA හි සමස්ථ ආදායමෙන් 60%ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම දායකත්වය දක්වන අතර කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් සහ ආර්ථික අර්බුදයේ බලපෑම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඇති ඉල්ලුම සහ ක්ෂේත්‍රයට අලුතින් ඇතුල්වන්නන් පහත වැටීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

2023 වර්ෂය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉලක්කය 2800 ක් වූ අතර ඉලක්කයට සාපේක්ෂව වර්ෂය සඳහා ලියාපදිංචි කර ඇති මුළු කොන්ත්‍රාත්කරුවන් 3109ක් (පුද්ගලයන් සංඛ්‍යාව) විය. සංසන්දනාත්මකව, ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ කුඩා/මධ්‍ය පරිමාණ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම හේතුවෙන් 2023 වසරේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

| **ලියාපදිංචි කිරීමේ වර්ගය** | **ලියාපදිංචිවීම් සංඛ්‍යාව - 2023** |
|---|---|
| නව | 540 |
| උත්ශ්‍රේණිගත කිරීම | 297 |
| අලුත් කිරීම | 829 |
| අමතර | 63 |
| දීර්ඝ කිරීම | 1141 |
| පහත දැමීම | 49 |
| **එකතුව** | **2919** |

6.2.1 වගුව: ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්

| **ලියාපදිංචි කිරීමේ වර්ගය** | **ලියාපදිංචිවීම් සංඛ්‍යාව - 2023** |
|---|---|
| නව | 70 |
| උත්ශ්‍රේණිගත කිරීම | 21 |
| අලුත් කිරීම | 43 |
| අමතර | 06 |
| දීර්ඝ කිරීම | 87 |
| පහත දැමීම | - |
| **එකතුව** | **229** |

6.2.2 වගුව: විද්‍යුත් යාන්ත්‍රික ඉදිකිරීම්වල නිරත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්

| ලියාපදිංචි කිරීමේ වර්ගය | **ලියාපදිංචිවීම් සංඛ්‍යාව - 2023** |
|---|---|
| නව | 33 |
| උත්ශ්‍රේණිගත කිරීම | 06 |
| අලුත් කිරීම | 16 |
| අමතර | 01 |
| දීර්ඝ කිරීම | 42 |
| පහත දැමීම | 0 |
| එකතුව | **98** |

6.2.3 වගුව: විශේෂිත ඉදිකිරීම්වල නිරත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්

| ලියාපදිංචි කිරීමේ වර්ගය | ලියාපදිංචිවීම් සංඛ්‍යාව - 2023 |
|---|---|
| නව | 0 |
| උත්ශ්‍රේණිගත කිරීම | 0 |
| අලුත් කිරීම | 03 |
| අමතර | 0 |
| දීර්ඝ කිරීම | 04 |
| පහත දැමීම | 0 |
| එකතුව | **07** |

6.2.4 වගුව: පයිල් කිරීමේ කාර්යයන්වල නිරත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්

*සටහන- දීර්ඝ කිරීම් ඇතුළුව සහ ගනුදෙනු මත පදනම් වේ.*

### 6.2.2 මාර්ගගත ලියාපදිංචිය – වැඩිදියුණු කිරීමේ යෝජනාව

ඒකාබද්ධ අරමුදලින් 2023 වසර සඳහා රුපියල් මිලියන 2.5 ක් වෙන් කර ඇති අතර මාර්ගගත ලියාපදිංචිය වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ මාර්ගගත ලියාපදිංචියේ ප්‍රගතිය ධනාත්මක වන අතර එම කාර්යය 2024 පළමු කාර්තුවේදී අවසන් කරනු ඇත.

### 6.2.3 ලියාපදිංචි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා සහනයක් හඳුන්වාදීම

මෑත අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ සහ ඉන් පසුව ඉදිකිරීම් කර්මාන්තයට සහාය වීම සඳහා, 2023.12.01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉදිකිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය (CCR) සඳහා ඇතුළත් වීමේ සහ අලුත් කිරීමේ සුදුසුකම් තාවකාලිකව වසරක කාලයක් සඳහා ලිහිල් කිරීමක් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, වසරක කාලයක් සඳහා පද්ධතියේ පැවැත්ම සහතික කිරීම සඳහා ලියාපදිංචි වීමේ ධාරිතාවය වැඩි කිරීම සහ එමඟින් ඔවුන් පද්ධතිය තුළ රඳවා තබා ගැනීම සඳහා මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රවේශවීමේ/අලුත් කිරීමේ සුදුසුකම් ලිහිල් කිරීම හඳුන්වා දෙන ලදී.

### 6.2.4 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු ලියාපදිංචිය සඳහා වන සංශෝධන

ආර්ථික වාතාවරණය සහ උද්ධමනය හේතුවෙන් ඉහළ යන මෙහෙයුම් පිරිවැය සැලකිල්ලට ගනිමින්, ප්‍රධාන සහ විශේෂඥ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා මූල්‍ය සීමාව සහ අලුත් කිරීමේ/ලියාපදිංචි කිරීමේ නිර්ණායකවලට ගැලපීම් සිදු කරමින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජිත සංශෝධන මෙම වසරේ නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලදී.

### 6.2.5 දේපළ සංවර්ධකයන් ලියාපදිංචි කිරීම

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දේපළ සංවර්ධන කර්මාන්තය විධිමත් කිරීම, අවසාන පරිශීලක තෘප්තිය සහ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම සහ කර්මාන්තයේ ප්‍රතිරූපය ගොඩනැගීම ඇතුළු ආරවුල් අවම කිරීම දේපළ සංවර්ධකයින් ලියාපදිංචි කිරීමේ අරමුණු වේ.

පරීක්ෂා කිරීම සඳහා නොමිලේ ලබා ගත හැකි දේපළ සංවර්ධකයින්ගේ ලේඛනයක් පවත්වාගෙන යන ලෙස 2014 අංක 33 දරන CID පනත මඟින් CIDA වෙත නියම කර ඇත. අදාළ ගැසට් පත්‍රය 2023 දී ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේවෙතත්, මෙම ප්‍රතිපාදනය මඟින් දේපළ සංවර්ධකයාට ඔවුන්ගේ ආයෝජනවල ස්පෘශ්‍ය ප්‍රතිලාභවලට වඩා අගය එකතු කිරීමක් පමණක් සපයයි. එබැවින්, මේ වනවිට දේපළ සංවර්ධකයින් විසින් ලියාපදිංචිය ලබා ගැනීමට මැලිකමක් දක්වයි.

ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ සියලුම අයදුම්පත් කාර්යක්ෂමව සකස් කරන බව සහතික කිරීමට සංවර්ධන අංශය කැපවී සිටින අතර එමඟින් ඉදිරි වසර තුළ දේපළ සංවර්ධන අංශය අඛණ්ඩව දියුණු වනු ඇතැයි විශ්වාස කෙරේ.

2023 අවසානය වන විට දේපළ සංවර්ධකයින් මුළු සංඛ්‍යාව 13 ක් නියාමන ආයතනය සමඟ ලියාපදිංචි වී ඇත.

### 6.2.6 ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

CIDA විසින් 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ 43 වගන්තිය යටතේ සහ ජූනි 06 දිනැති අංක 2336/46 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව රාජ්‍ය අංශය තුළ ප්‍රසම්පාදන කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ (MSR) මුලපිරීම ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන 2023 වර්ෂයේදී එයටම වෙන්වූ දැනුම්වත් කිරීමේ ව්‍යාපාරයක් සමඟ ආරම්භ කර ඇති අතර මෙම වැඩසටහන දැනටමත් එහි ඉලක්ක කරා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත:

2023 ඔක්තෝබර් 5 දින ප්‍රකාශයට පත් කරන ලද පුළුල් ලෙස බෙදා හරින ලද පුවත්පත් දැන්වීමක් මඟින් ලියාපදිංචි වීමේ ප්‍රතිලාභ පිළිබඳව විභව සැපයුම්කරුවන්ගේ අවධානය සාර්ථකව යොමු කරවන ලදී.

සුදුසුකම් ලත් සැපයුම්කරුවන් සඳහා ඇතුළත් වීමේ ක්‍රියාවලිය සරල කරමින් පරිශීලක-හිතකාමී ලියාපදිංචි අයදුම්පතක් මුලපිරීම සමඟ ක්‍රියාත්මක කරන ලදී.

2023 දී අවසන් කර මුද්‍රණය කරන ලද CIDA ද්‍රව්‍ය සැපයුම් මාර්ගෝපදේශය සදාචාරාත්මක සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන භාවිතයන් සඳහා පුළුල් රාමුවක් සපයයි.

මූලික ද්‍රව්‍ය ලැයිස්තුවක් සකස් කර අවසන් කර ඇති අතර, වෙනස් වන අවශ්‍යතාවලට අනුවර්තනය වීම සඳහා එය නිරන්තරයෙන් සංශෝධනය කරනු ලැබේ.

සියලුම රාජ්‍ය ආයතනවලට මෙම වැඩසටහන පිළිබඳව විධිමත් ලෙස දැනුම් දී ඇති අතර විශ්වාසදායක හවුල්කරුවන්ගේ ශක්තිමත් ජාලයක් ස්ථාපිත කරමින් CIDA-ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පමණක් ද්‍රව්‍ය ලබා ගැනීමට දිරිමත් කර ඇත.

### 6.2.7 නිශ්චල දේපළ නියෝජිතායතන ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) විසින් මුදල් විශුද්ධිකරණයට එරෙහි/මූල්‍ය ත්‍රස්තවාදයට එරෙහිව (AML/CFT) සඵලතාවය වැඩිදියුණු කිරීමේ අදහසින් ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ කර්මාන්තය නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට FIU අදහස් කරන බව දන්වා ඇති අතර, CID පනත යටතේ නිශ්චල දේපළ පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසු ආයතනය ලෙස CIDA හඳුනාගෙන ඇත.

ඒ අනුව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2014 අංක 33 දරන CID පනතට යෝජිත සංශෝධන සිදු කිරීමට පියවර ගත යුතු අතර මහ බැංකුව විසින් යෝජනා කරන ලද ක්‍රියාවලියට සහාය වීම සඳහා අවශ්‍යතා හඳුනාගැනීම සඳහා ක්‍රියාකාරී කමිටුව සමඟ කටයුතු කළ යුතුය.

### 6.2.8 විදේශීය කොන්ත්‍රාත්කරුවන් තාවකාලික ලියාපදිංචි කිරීම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 39 වැනි වගන්තිය මඟින් සහ පසුව නිකුත් කරන ලද 2018 අගෝස්තු 23 දිනැති 2085/19 ගැසට් නිවේදනය මඟින් විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සහ සේවයේ නියුක්ත කිරීම නියාමනය කරනු ලැබේ. 2016 වර්ෂයේදී සියලුම පාර්ශ්වකරුවන් නියෝජනය කරන කමිටුවක් මඟින් සකස් කරන ලද නිර්ණායක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කර ඇත.

ගැසට් නිවේදනය නිකුත් කරන අවස්ථාවේ දැනටමත් ව්‍යාපෘති ආරම්භ කර ඇති කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා දැඩි අවශ්‍යතාවලට අනුකූල නොවන සාධාරණ යාන්ත්‍රණයක් ද හඳුන්වා දිය යුතුය.

විදේශීය කොන්ත්‍රාත්කරුවන් 22ක් ලියාපදිංචි කිරීමේ 2023 ඉලක්කය සපුරා නොතිබුණද, ලැබුණු අයදුම්පත් 03ම සාර්ථකව සලකා බලා අවසන් කරන ලදී. අනාගත අයදුම්පත් ධාරිතාවය සහ සේවා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අපි අපගේ ඉලක්කගත උපාය මාර්ග සහ ක්‍රියාවලි විධිමත් කිරීම සමාලෝචනය කරමින් සිටින්නෙමු.

### 6.2.9 සුදුසුකම් ලත් තැනැත්තන්/සමාගම් ලියාපදිංචි කිරීම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 26 සහ 33 වගන්ති ප්‍රකාරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට (CIDA) වෘත්තීයමයභාවයේ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන් සහ පරිචයන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යෑම සඳහා අධිකාරි බලයක් පැවරී ඇත. 2023 වසර සඳහා වන මාර්ගගත ලේඛනය CIDA වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

### 6.2.10 තනි පුද්ගල විදේශ උපදේශකයින් තාවකාලිකව ලියාපදිංචි කිරීම

2023 වර්ෂය තුළ, 33 වන වගන්තිය සඳහා වන කෙටුම්පත් රෙගුලාසි එනම් විදේශ උපදේශකයින්, ගාස්තු පිළිබඳ නැවත බැලීමක් සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සමාලෝචනයට ලක්ව තිබුණි. පවතින තත්ත්වය සැලකිල්ලට ගනිමින් USD වලින් ගාස්තු අය කිරීමට යෝජනා කර ඇති අතර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබීමට නියමිතව තිබුණි.

2023 න්‍යාය පත්‍රය යටතේ නිර්ණායක හඳුන්වා දීම සහ සමාගම් ලියාපදිංචිය සඳහා සුදුසු ගාස්තු ලබා දීමෙන් සුදුසුකම් ලත් පුද්ගලයන්ගේ ආයතන ලියාපදිංචි කිරීම ප්‍රධාන ක්‍රියාකාරකමක් විය. පවතින රෙගුලාසි නිර්ණායක / ගැසට් පත්‍රයට (අංක 2057/5 දරන 2018.02.05 දිනැති) නිසි සංශෝධන සිදු කිරීමෙන් පසුව 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### 6.2.11 ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා CIDA සම්මාන 2020/2021





ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තීයභාවය සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කරන වාර්ෂික සම්මාන යෝජනා ක්‍රමය 1990 දී ආරම්භ විය. මෙම සම්මාන යෝජනා ක්‍රමය ඉදිකිරීම් කළමනාකරණයේ කැපී පෙනෙන කාර්ය සාධනය, තාක්ෂණික විශේෂඥතාව සහ ගුණාත්මකභාවය පිළිබඳ ඉහළ වෘත්තීයමයභාවය, නව්‍ය සහ සුදුසු තාක්ෂණය හඳුන්වාදීම හඳුනා ගනී.




කොවිඩ්-19 වසංගතය සහ ආයතනික අයවැය සීමාවන් විසින් ප්‍රතිඵලය වූ වසර දෙකක ඇණහිටීමකින් පසු 2023 සඳහා විශිෂ්ටතා සම්මාන ප්‍රදානය ආරම්භ කරන ලද අතර, මෙම උත්සවය අපගේ ආයතනය නිර්වචනය කරන නොසැලෙන කැපවීම සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ප්‍රබල සාක්ෂියක් විය.

- සම්මාන සඳහා අයදුම්පත් කැඳවීම.

ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා ජාතික සම්මාන-2022/2023 සඳහා ජාතික පුවත්පත් හරහා අයදුම්පත් කැඳවන ලදී. 2023 වසර සඳහා ඉදිකිරීම් කාර්ය සාධන සම්මාන සඳහා අයදුම්පත් 17ක්, හරිත සම්මාන සඳහා අයදුම්පත් 2ක් සහ ඉදිකිරීම් විශිෂ්ටතා සම්මාන සඳහා අයදුම්පත් 3ක් ලැබුණු අතර 2023 වර්ෂය තුළ වැඩපොළ පරිශ්‍ර චාරිකා15 ක් සම්පූර්ණ කරන ලදී. උත්සවය 2023.06.30 දින පැවැත්විණි.

### 6.2.12 ඉදිකිරීම් වැඩබිම්වල ඩෙංගු වැළැක්වීමේ කාර්යයන්/නිරීක්ෂණ කාර්යයන්

CIDA නිරීක්ෂණ කණ්ඩායම රටේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රදේශය වන කොළඹ දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ස්ථානවල තත්කාර්ය සංචාර සිදු කරන ලදී. කණ්ඩායමට NDCU නිලධාරීන්, ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සහ පරිසර පොලිසියේ නිලධාරීන් ද ඇතුළත් විය. CIDA නිරීක්ෂණ කණ්ඩායම සහ CIDA හි දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් (DCOs) ඩෙංගු බෝවීම පාලනය කිරීම සහ අනෙකුත් සෞඛ්‍ය ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් මෙම වසර පුරා ඔවුන්ගේ වැඩබිම් චාරිකාවල නිරත විය.

CIDA නිරීක්ෂණ කණ්ඩායම සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් (DCO) 2023 වර්ෂය තුළ ඉදිකිරීම් ස්ථාන චාරිකා 402ක් සිදු කර ඇත

### 6.2.13 තොරතුරු තාක්ෂණ (IT) ඒකකයේ කාර්ය සාධනය

ආයතනික කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය වැඩිදියුණු කිරීමට දායක වෙමින් CIDA හි සංවර්ධන අංශය යටතේ ඇති තොරතුරු තාක්ෂණ ඒකකය 2023 දී සැලකිය යුතු සන්ධිස්ථාන සනිටුහන් කරන ලදී. සාක්ෂාත් කර ගැනීම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් පහත දක්වා ඇත.

- **මාර්ගගත ගෙවීම් පහසුකම ක්‍රියාත්මක කිරීම**

තොරතුරු තාක්ෂණ ඒකකය විසින් ප්‍රකාශන සඳහා CIDA වෙබ් අඩවියට අන්තර්ජාල ගෙවීම් ද්වාරයක් (IPG) සාර්ථකව ඒකාබද්ධ කරන ලද අතර, ගනුදෙනු කිරීමේ කාර්යක්ෂමතාව සහ භාවිතයේ පහසුව ඉහළ නංවමින් පාර්ශ්වකරුවන්ට පහසුවෙන් මාර්ගගත ගෙවීම් සිදු කිරීමට හැකියාව ලබා දෙන ලදී.

- **ෆයර්වෝල් වැඩිදියුණු කිරීම**

ආයතනික දත්තවල අඛණ්ඩතාව සහ රහස්‍යභාවය සහතික කරමින් දත්ත පද්ධතිවල ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ සයිබර් තර්ජනවලින් ආරක්ෂා කිරීම අරමුණු කර ගත්, ඉහළ ආරක්ෂිත විශේෂාංග සහිත නව ෆයර්වෝලයක් ආයතනය තුළ ස්ථාපනය කරන ලදී.

- **උපදේශන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය**

උපදේශන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් තොරතුරු තාක්ෂණ ඒකකය විසින් මිලියන 100 ක ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියට ERP විසඳුම්, මානව සම්පත් කළමනාකරණ ද්වාර, ICT දෘඩාංග සහ මෘදුකාංග ස්ථාපනයන්, සේවාදායක නඩත්තුව, සහ CIDA, CHPB, සහ OTC මධ්‍යස්ථාන ඒකාබද්ධ කිරීම වැනි මොඩියුල ඇතුළත් වේ. ව්‍යාපෘතිය යටතේ පුහුණු ශිල්පී බලපත්‍ර ලබා දීම සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ මෘදුකාංග සංවර්ධනය සිදු වෙමින් පවතින අතර 2024 මුල් භාගයේදී අවසන් කිරීමට නියමිතය. වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සම්පත් කළමනාකරණයක් ලබා දෙමින් වසර තුනක් ඇතුළත ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂා කෙරේ.

### 6.2.14 සංවර්ධන අංශය විසින් උත්පාදනය කළ ආදායම

2023 වර්ෂයේදී සංවර්ධන අංශය රු. 164,659,779.00ක් උපයා ඇත.

## 6.3 කර්මාන්ත පුහුණු අංශය

ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධන ගම්‍යතාවය පවත්වා ගැනීම සඳහා පුහුණු මානව සම්පත් පවතින බව සහතික කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ සියලුම කොටස් හිමියන්ගේ ධාරිතා වර්ධනය කිරීමට කාර්මික පුහුණු අංශය කැපවී සිටී.

ඉදිකිරීම් ක්ෂේත්‍රය වර්තමානයේ අත්විඳිමින් සිටින පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය මෙම නැගී එන දැවැන්ත වර්ධනයට අහිතකර බලපෑමක් ඇති කරයි. ඉදිකිරීම් කර්මාන්තයේ ශ්‍රම බලකායේ ධාරිතා ගොඩනැගීම සඳහා ප්‍රධාන වශයෙන් නියෝජනය කරන මෙම අංශය කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය සඳහා කැපවී සිටී.

### 6.3.1 ඉදිකිරීම් අංශයේ නිපුණතා සංවර්ධනය - ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන

ඉදිකිරීම් ව්‍යාපෘති නිසි ලෙස නිම කිරීමට බලපෑමක් ඇති කරමින් පෙදරේරුවන්, වඩු කාර්මිකයන්, ජලනල කාර්මිකයන් සහ ටයිල් අතුරන්නන් වැනි ඉදිකිරීම් කර්මාන්තයේ පුහුණු ශිල්පීන්ගේ හිඟයක් පවතී;

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින මෙම ගැටලුව විසඳීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය වන CIDA විසින් NAITA (ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය), NCASL (ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය) සමඟ සහයෝගිත්වයෙන් 2023 වර්ෂයේදී රැකියාස්ථ පුහුණු වැඩසටහන සම්පූර්ණ කර ඇත.

පෙදරේරු, වඩු වැඩ, ටයිල් කිරීම, යකඩ නැමීම සහ ජලනල යන කාණ්ඩ යටතේ පුහුණු වැඩසටහන් සිදු කරන ලදී. තෝරාගත් අභ්‍යාසලාභීන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය, පුහුණු කාලය සඳහා ඔවුන්ගේ දෛනික වියදම් පියවා ගැනීම සඳහා රු. 10,000/- මාසික දීමනාවක් මාස තුනක් දක්වා ලබා දෙන ලදී. තවද, විශේෂිත වෘත්තීය කාණ්ඩය සඳහා අදාළ මූලික මෙවලම් ඇතුළත් මෙවලම් කට්ටලයක් මෙන්ම පුහුණුවන්නන් සඳහා අභිප්‍රේරණයක් ලබා දීම සඳහා ආරක්ෂක ආම්පන්න සහ පිළිගත් ඇඳුම් කට්ටලයක් ද ලබා දෙන ලදී.

### 6.3.2 ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්පී හැඳුනුම්පත් නිකුත් කිරීම

CID පනතේ 48 සහ 49 වගන්තිවලට අනුව, හඳුනාගත් ඉදිකිරීම් ව්‍යාපෘතිවල නිරත වන සියලුම ඉදිකිරීම් ශිල්පීන් CIDAහි ලියාපදිංචි වී ශිල්පී හැඳුනුම්පතක් ලබාගෙන තිබිය යුතුය. ඔවුන්ගේ නිපුණතා මට්ටම වර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ ඔවුන්ට නිසි පිළිගැනීමක් ලබා දීම සඳහා "පුහුණු පුද්ගලයින්" ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ඇත. පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ ලියාපදිංචිය සිදු කෙරේ.

I. පුහුණු ඉදිකිරීම් ශිල්පීන්

II. ඉදිකිරීම් ස්ථාන අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ අනෙකුත් වෘත්තිකයන්

ශිල්පී කාණ්ඩ සහ වෘත්තීය කාණ්ඩ 27ක් යටතේ හඳුනාගන්නා ලද පුහුණු ඉදිකිරීම් ශිල්පීන් සඳහා ශිල්පී හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. එනම් ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු), විදුලි කාර්මික, දැව ශිල්පී (ගොඩනැගිලි), ජලනල ශිල්පී, දැව ශිල්පී (ලී බඩු), යකඩ නවන්නන්, ටයිල් අතුරන්නන්, වෙල්ඩින්කරුවන්, පින්තාරුකරුවන් (ගොඩනැගිලි), ඇලුමිනියම් පිරිසැකසුම්කරු සහ වෙනත් නැගී එන ශිල්පීන්. ශිල්පී සහ ප්‍රධාන ශිල්පී ලෙස ප්‍රධාන ශ්‍රේණි දෙකකට හැඳුනුම්පත් නිකුත් කෙරේ. මේ වනවිට ශිල්පී හැඳුනුම්පත් 248ක් නිකුත් කර ඇත.

### 6.3.3 RPL (පෙර ඉගෙනුම් පිළිගැනීම) වැඩසටහන

RPL (පෙර ඉගෙනුම් පිළිගැනීම) වැඩසටහන 2023 සිව්වන කාර්තුවේදී ආරම්භ වූ අතර ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවන ලදී. මෙම වැඩසටහන පළපුරුදු ශිල්පීන්ට NVQ 3 හෝ 4 මට්ටමේ සුදුසුකම් සහ අදාළ කාණ්ඩයේ CIDA හැඳුනුම්පත ලබා ගැනීමට මග පාදයි.

කර්මාන්ත පුහුණු අංශය විසින් RPL වැඩසටහන යටතේ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) හරහා ඉදිකිරීම් ශිල්පීන් (පෙදරේරු), විදුලි කාර්මික, වඩු කාර්මික ශිල්පීන් (ඉදිකිරීම්), ජලනල කාර්මික, වඩු කාර්මික වැඩ ශිල්පීන් (ගෘහ භාණ්ඩ), යකඩ නවන්නන්, ටයිල් අතුරන්නනන්, වෙල්ඩින්කරුවන්, පින්තාරුකරුවන් (ගොඩනැගිලි), ඇලුමිනියම් පිරිසැකසුම්කරුවන් යනාදිය සහ ඉදිකිරීම් අංශයේ නැගී එන කවර හෝ ශිල්පීන් සඳහා NVQ මට්ටමේ 3 හෝ 4 සහතික ලබා දෙයි.

2023 දී පුහුණු අංශය විසින් ඉදිකිරීම් ශිල්පීන් 35 දෙනෙකු සඳහා RPL වැඩසටහන් 4ක් පවත්වා ඇත.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව | RPL වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| විදුලි කාර්මික | 28 | 03 |
| පෙදරේරු | 07 | 01 |

6.3.1 වගුව: RPL වැඩසටහන් සංඛ්‍යාව

### 6.3.4 පුහුණු වැඩසටහන්

තාක්ෂණික වෘත්තීමය රැකියා අවස්ථා ලබා ගැනීම සහ එමගින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රම බලකාය ඉහළ නැංවීම සඳහා පුහුණු අංශය විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රම බලකායේ අධීක්ෂණ සහ කළමනාකරණ මට්ටම් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.



#### 6.3.4.1 කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ කළමනාකරණ නිපුණතා වර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පවත්වන ලදී. මෙම වැඩසටහන සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර කොන්ත්‍රාත් කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ ඔවුන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණුවීම් සිදු කරනු ලැබේ.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 95 | 05 |

6.3.2 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

### 6.3.4.2 වැඩමුළු සහ සම්මන්ත්‍රණ

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ රැකියාවල නියුතු පුද්ගලයන්ට විවිධ මාතෘකා පිළිබඳ දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 194 | 03 |

6.3.3 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

2023 වර්ෂයේදී පහත වැඩසටහන් පවත්වන ලදී.

| වැඩසටහනේ නම | සහභාගිවන්නන් සංඛ්‍යාව |
|---|---|
| සම්පූර්ණ ස්ථාන සමීක්ෂණය සඳහා හැඳින්වීම | 45 |
| කෘෂිකර්මාන්තයේ තාක්ෂණවේදීන් සඳහා USAID අරමුදල් ලැබූ පුහුණු වැඩසටහන | 131 |
| සම්පූර්ණ ස්ථාන සමීක්ෂණය පිළිබඳ ප්‍රායෝගික සැසිය | 18 |

6.3.4 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

### 6.3.4.3 ගනුදෙනුකරුවන් ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන

පහත සඳහන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල ඉල්ලීම පරිදි ඔවුන් ඉල්ලා සිටි මාතෘකා යටතේ පුහුණු වැඩසටහන් පහත පරිදි පවත්වන ලදී.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| **ගනුදෙනුකරුවන් ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන** | 51 | 3 |

6.3.5 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

2023 වර්ෂයේදී පහත වැඩසටහන් පවත්වන ලදී

| වැඩසටහනේ නම | සහභාගිවන්නන් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂිත නැව් කඹ (rigging) පිළිවෙත් | 2 |
| විදුලි පද්ධතිය නඩත්තු කිරීම | 1 |

6.3.6 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

### 6.3.4.4 ඉදිකිරීම් ආරවුල් විසඳීමේ ජංගම සායනය සහ ශිල්පී හැඳුනුම්පත් පිළිබඳ දැනුම්වත් කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් සඳහා ඉදිකිරීම් ආරවුල් විසඳීමේ සායනයක් සහ RPL (පෙර ඉගෙනීම පිළිගැනීම) වැඩසටහන යටතේ ඉදිකිරීම් ශිල්පීන්ට ජාතික ශිල්පී හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා සහ ඔවුන්ට NVQ 3 හා 4 සුදුසුකම් ලබා දීම සඳහා ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම ගාල්ල, කළුතර සහ පුත්තලම දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

### 6.3.5 නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB)

නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) යනු ලියාපදිංචි අංක POI/054 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලත් ISO 9001:2015 QMS සහ ISO 21001:2018 EOMS සහතික ලත් ආයතනයකි. CHPB යනු කර්මාන්ත පුහුණු අංශයට අනුයුක්ත CIDA විසින් කළමනාකරණය කරනු ලබන බහු-විෂය ආයතනයකි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින තාක්ෂණ ශිල්පීන්, වෘත්තිකයන් සහ සියලුම කළමනාකරණ, අධීක්ෂණ සහ ශිල්පීන්ගේ වෘත්තීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා CHPB ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. මෙම තාක්ෂණික සැසි සඳහා ලැබී ඇති අතිමහත් ප්‍රතිචාරය ඉතාමත් වටිනා පාඨමාලා පැවැත්වීමේ දී CHPB හි වෘත්තීයභාවය පිළිබඳ සාක්ෂියකි.





2023 වර්ෂයේදී, CHPB විසින් විධායකයින්, ඉංජිනේරුවන්, උනන්දුවක් දක්වන පුද්ගලයන්, ඉදිකිරීම් කළමනාකරුවන් සහ පාසල් හැර ගිය අය සඳහා ඉදිකිරීම් සහ ප්‍රමාණ මැනුම් ක්ෂේත්‍ර සඳහා හිඩැස් පිරවීමේ පුහුණු වැඩසටහන් සපයා ඇත.

### 6.3.5.1 NVQ 4/ භූ දර්ශන සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව

2023 වර්ෂයේදී භූ දර්ශන ක්ෂේත්‍රයට අධීක්ෂකවරුන් ලෙස ඇතුළු වීමට කැමති පාසල් හැර ගිය අය සහ තරුණ උනන්දුවක් දක්වන්නන් සඳහා භූ දර්ශන සංවර්ධන සහකාර (NVQ 4 මට්ටම) පාඨමාලා පවත්වන ලදී. 2023 වර්ෂයේදී අභ්‍යන්තර අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ ක්ෂේත්‍රවලට අධීක්ෂකවරුන් ලෙස ඇතුළත් වීමට කැමති පාසල් හැර ගිය අය සහ තරුණ උනන්දුවක් දක්වන්නන් සඳහා NVQ 4 මට්ටමේ අභ්‍යන්තර අලංකරණ පාඨමාලා පවත්වන ලදී.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|
| අභ්‍යන්තර අලංකරණ | 16 |
| වැඩපොළ අධීක්ෂක | 18 |

6.3.7 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

2023 වර්ෂයේදී, පළපුරුදු ඉදිකිරීම් වැඩ අධීක්ෂකවරුන්, තාක්ෂණික නිලධාරින්, සහකාර ප්‍රමාණ සමීක්ෂකයින් සහ සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන්නන් සඳහා ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා

පුහුණු වැඩසටහන සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) විෂයමාලාව මත පදනම්ව ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලා පවත්වන ලදී.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|
| ඩිප්ලෝමා | 15 |

6.3.8 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

### 6.3.5.2 ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පරිගණක පාඨමාලා

2023 වර්ෂයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ පරිගණක පාඨමාලා වර්ග තුනක් පවත්වන ලදී.

| කාණ්ඩය | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|
| MS ප්‍රොජෙක්ට් | 37 |
| ඔටෝ කැඩ් | 11 |
| ප්‍රිමාවේරා | 25 |

6.3.9 වගුව : වැඩසටහන් සංඛ්‍යාව

CHPB විසින් 2023 වසර සඳහා පහත සඳහන් කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

| කාණ්ඩය | වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|
| MEP ප්‍රමාණ සමීක්ෂණ | 02 | 41 |
| BOQ මිලකරණය | 01 | 27 |

6.3.10 වගුව: වැඩසටහන් සංඛ්‍යාව

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ව්‍යාපෘතිවල නියැලී සිටින ඉංජිනේරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන් සහ සැලසුම්කරුවන් සඳහා මෙම වැඩසටහන පැවැත්විණි.

### 6.3.5.3 සේවකයින්ගේ නිපුණතාවය ඉහළ නැංවීම

ඉදිකිරීම් සේවකයන්, අධීක්ෂකවරුන්, තාක්ෂණික නිලධාරීන්, ඉංජිනේරුවන්, විධායකයින් සහ ව්‍යවසායකයින්ගේ නිපුණතාවය ඉහළ නැංවීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. මෙම පාඨමාලා හැදෑරීමට කර්මාන්ත අත්දැකීම් සහ අවශ්‍ය සුදුසුකම් සපුරාලිය යුතු වේ.

### 6.3.5.4 අභිරුචිකරණය කළ/කෙටි කාලීන පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලැබුණු නිශ්චිත පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා අභිරුචිකරණය කළ පුහුණු වැඩසටහන් සාර්ථකව සැලසුම් කිරීමට සහ ලබා දීමට CHPB සමත් විය.

| මාතෘකාව | සේවාදායකයා | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|
| BOQ සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | ඩේවිඩ් පීරිස් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම | 11 |
| විදුලි තාක්ෂණය පිළිබඳ වැඩසටහන (නේවාසික) | ඉන්ටෙල් සොලූෂන්ස් ලංකා (පෞද්.) සමාගම | 20 |
| මිල උච්ඡාවචන සූත්‍රය පිළිබඳ වැඩසටහන | කොළඹ මහ නගර සභාවේ තාක්ෂණික කාර්ය මණ්ඩලය | 36 |
| භූ දර්ශන සැලසුම් පිළිබඳ පුහුණු වැඩසටහන | කොළඹ මහ නගර සභා නිලධාරින් | 07 |

6.3.11 වගුව: වැඩසටහන් සංඛ්‍යාව

### 6.3.5.5 සම්මන්ත්‍රණ සහ වැඩමුළු

2023 වර්ෂයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රය පුරා පැතිරී ඇති විවිධ රැකියා කාණ්ඩවල නියැලී සිටින පිරිස් වෙත විවිධ මාතෘකා පිළිබඳ දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු මාසිකව සංවිධානය කරන ලදී.

2023 වසර සඳහා CHPB විසින් පුද්ගලයන් 1002 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ 23 ක් භෞතිකව පවත්වන ලදී.

කොවිඩ්-19 තත්ත්වයෙහි අහිතකර බලපෑම අවම කිරීම සඳහා නව උපාය මාර්ගයක් ලෙස මාර්ගගත සම්මන්ත්‍රණ 07ක් පවත්වන ලදී.

එම සම්මන්ත්‍රණවල ලැයිස්තුවක් පහත දක්වා ඇත.

| සම්මන්ත්‍රණය/වැඩමුළුව | සහභාගිවූවන් සංඛ්‍යාව | දින ගණන | මාර්ගගත/භෞතික |
|---|---|---|---|
| පින්තාරු කිරීමේ තාක්ෂණය | 26 | 1 | භෞතික |
| ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ වත්මන් ගැටලු | 16 | 1 | භෞතික |
| පදනම් ඉංජිනේරු මූලධර්ම | 17 | 1 | භෞතික |
| වායු සමීකරණ ස්ථාපනය සහ නඩත්තුව පිළිබඳ යහ ඉංජිනේරු භාවිතයන් | 51 | 1 | භෞතික |
| රාජ්‍ය සහ පෞද්ගලික අංශ කොන්ත්‍රාත්වල ප්‍රමාදයන්, ආරවුල්, ගැටලු, හිමිකම්, දූෂණ වගන්ති, නීති විරෝධී වගන්ති, ප්‍රායෝගික නොවන පිරිවිතර නිර්මාණය කරන්නේ කවුද? | 41 | 1 | මාර්ගගත |
| ඇලුමිනියම් පිරිසැකසුම්කරණය පිළිබඳ වැඩමුළුව | 10 | 1 | භෞතික |
| විදුලි තාක්ෂණය (නේවාසික) | 42 | 1 | භෞතික |
| ටෙන්ඩර් / ලංසු ලේඛනය සකස් කිරීම | 62 | 1 | මාර්ගගත |
| ඉදිකිරීම් කර්මාන්තය සඳහා දැව භාවිතය පිළිබඳ වැඩමුළුව | 16 | 1 | භෞතික |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සම්මන්ත්‍රණය | 24 | 1 | භෞතික |
| CIDA මිල උච්චාවචන සූත්‍රය පිළිබඳ සම්මන්ත්‍රණය | 55 | 1 | භෞතික |
| ජලරෝධක ශිල්පීය ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණය | 20 | 1 | භෞතික |
| ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත් නීතිය සහ ආරවුල් විසඳීමේ පරිචය පිළිබඳ සම්මන්ත්‍රණය | 48 | 1 | මාර්ගගත |
| අකුණු ආරක්ෂණ පද්ධති පිළිබඳ හැඳින්වීම විදුලි තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය (කර්මාන්ත) | 16 | 1 | භෞතික |
| විදුලි තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය (කර්මාන්ත) ඉදිකිරීම් ස්ථාන වල ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය | 25 | 1 | භෞතික |
| පිරිවැය ඵලදායී නිවාස ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 15 | 1 | භෞතික |
| ජලනල තාක්ෂණයේ ප්‍රායෝගික යෙදුම් පිළිබඳ සම්මන්ත්‍රණය (ගෘහස්ථ) | 26 | 1 | භෞතික |
| පූර්ව/පශ්චාත් කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 54 | 1 | භෞතික |
| MEP ප්‍රමාණකරණය සඳහා ප්‍රායෝගික ප්‍රවේශය පිළිබඳ සම්මන්ත්‍රණය | 38 | 1 | භෞතික |

| | | | |
|---|---|---|---|
| ඉදිකිරීම් ස්ථානවල ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය | 52 | 1 | මාර්ගගත |
| යටිතල පහසුකම් ව්‍යාපෘතියක එලදායී කොන්ත්‍රාත් පරිපාලනය, කාර්ය සාධන කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ සම්මන්ත්‍රණය | 44 | 1 | භෞතික |
| පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් හි කොන්ත්‍රාත් කළමනාකරණ පාරිභාෂිත බැඳීම පිළිබඳ සම්මන්ත්‍රණය | 26 | 1 | මාර්ගගත |
| විදුලි තාක්ෂණය (නේවාසික) | 21 | 1 | භෞතික |
| භූ දර්ශන ශිල්පීය ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණය | 20 | 1 | භෞතික |
| උඩ වැඩ කරන අතරතුර ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය | 28 | 1 | භෞතික |
| ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණයේ මූලික මූලධර්ම පිළිබඳ සම්මන්ත්‍රණය | 13 | 1 | භෞතික |
| ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය | 59 | 1 | මාර්ගගත |
| ඇලුමිනියම් පිරිසැකසුම්කරණය පිළිබඳ වැඩමුළුව | 52 | 1 | භෞතික |
| ඉදිකිරීම් වැඩපොළවල ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය (අතින් හැසිරවීම සහ ශබ්ද ඇසීම) | 35 | 1 | මාර්ගගත |
| ඉදිකිරීම්වල (මාර්ග සහ ගොඩනැගිලි) ද්‍රව්‍ය ගුණාංග සහ පරීක්ෂණ අවශ්‍යතා පිළිබඳ සම්මන්ත්‍රණය | 50 | 1 | භෞතික |

6.3.12 වගුව: සම්මන්ත්‍රණ/වැඩමුළුවලට සහභාගිවූවන් සංඛ්‍යාව

2023 වර්ෂයේ CHPB හි ප්‍රගතියේ සාරාංශය පහත වගුවේ දැක්වේ.

| **2023 දෙසැම්බර් අවසානය දක්වා ප්‍රගතිය** | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අංශය** | **වාර්ෂික ඉලක්ක** | | **ප්‍රගතිය (සමුච්චිත)** | | | |
| | **භෞතික** | **මූල්‍යමය (රු. මි.)** | **භෞතික** | **%** | **මූල්‍යමය (රු. මි.)** | **%** |
| නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) | 1,951 | 20.25 | 1570 | 80.5% | 21.81 | 107.7% |

6.3.13 වගුව: ඉලක්කවලට එදිරිව ප්‍රගතිය

### 6.3.6 උත්පාදනය කළ ආදායම

කර්මාන්ත පුහුණු අංශය මගින් උපයා ඇති ආදායම රුපියල් 5,763,971.00 කි.

## 6.4 විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය (EMS)

විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය ඉදිකිරීම් උපකරණ නියාමනය, අධීක්ෂණය, ධාරිතා ගොඩනැගීම සහ ඉදිකිරීම් උපකරණවල උපදේශන සේවා යන ක්ෂේත්‍ර මගින් ඉදිකිරීම් කර්මාන්තයට සේවා සපයයි. මෙම අංශය ඉදිකිරීම් උපකරණ කළමනාකරණය, කර්මාන්ත සහාය සහ ඉදිකිරීම් උපකරණ පුහුණු යන උප අංශ තුනකින් සමන්විත වේ.

CIDA හි විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයේ ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ කළමනාකරණ පුහුණු ඒකකය, ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), අංක 17 ඩී පී විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත. ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා CETRAC අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විත වේ. ව්‍යාපෘති සහ නඩත්තු කළමණාකරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්, වැඩපොළ අධිකාරීවරුන්, වැඩපොළ අධීක්ෂකයන්, ජ්‍යෙෂ්ඨ කාර්මිකයන්, කාර්මිකයන්, යන්ත්‍ර සහායකයන් සහ පාසල් හැර ගිය අය සඳහා පුහුණු පාඨමාලා CETRAC හි පවත්වනු ලැබේ.




### 6.4.1 CETRAC පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ කාර්මිකයින් වීමට අයදුම්පත් කැඳවා තෝරා ගන්නා ආධුනිකයන්ට නිපුණතා සංවර්ධන වැඩසටහනක් සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දැනට සිටින වෘත්තිකයන්ට සහ ශිල්පීන්ට නිපුණතා සංවර්ධන වැඩසටහන් ලෙස CETRAC විසින් කාණ්ඩ දෙකක් යටතේ පුහුණු වැඩසටහන් පවත්වයි.

#### 6.4.1.1 කර්මාන්තයට අලුතින් ප්‍රවේශවන්නන් සඳහා පාඨමාලා

තරුණ තරුණියන්ගේ විරැකියා ගැටලුව විසඳීමට උපකාර කිරීම සඳහා පාසල් හැර යන අය සඳහා නිර්මාණය කර සංවර්ධනය කරන ලද පාඨමාලා වාර්ෂිකව පවත්වනු ලැබේ. ඒ අනුව 2023 වර්ෂයේදී පහත පාඨමාලා පවත්වන ලදී.

#### 6.4.1.2. ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පී පාඨමාලාව

ඉදිකිරීම් උපකරණ තාක්ෂණික-පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සහයෝගිත්වයෙන් පවත්වනු ලැබේ. එය CETRACහි මාස 12ක ආයතනික පුහුණුවකින් සහ කර්මාන්තයේ මාස 12ක රැකියාස්ථ පුහුණුවකින් සමන්විත වසර දෙකක පාඨමාලාවකි. අ.පො.ස.(සා/පෙළ) සමත් පාසල් හැර ගිය තැනැත්තන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබයි.

නවීන ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ සියලුම අංග මෙම පුහුණු පාඨමාලාව මඟින් ආවරණය කරයි. වාර්ෂිකව බඳවාගන්නා අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 120කි.

මෙම අභ්‍යාසලාභීන්ට නොමිලේ නවාතැන්, පාඨමාලා ද්‍රව්‍ය, වැඩමුළු පහසුකම්, නිල ඇඳුම්, සහනදායී මිලට ආහාර සහ ආරක්ෂක ආම්පන්න ආදිය සපයා ඇත. මෙම වැඩසටහන හදාරන ලද අභ්‍යාසලාභීන් සියල්ලෝම පාහේ දේශීයව මෙන්ම විදේශයන්හිද ඉහළ ආදායම් ලබන රැකියා ලබා ඇත. ඔවුන්ගෙන් සමහරක් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා තමන්ගේම වැඩපොළ ආරම්භ කර ඇත.
මෙම වැඩසටහන සාර්ථකව නිම කරන අභ්‍යාසලාභීන්ට NVQ 4 මට්ටමේ සහතිකයක් පිරිනමනු ලැබේ.

### 6.4.1.3 ඉදිකිරීම් උපකරණ නඩත්තු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NVQ 5)

ඉදිකිරීම් උපකරණ නඩත්තු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව වසර දෙකක අර්ධකාලීන පාඨමාලාවකි. අ.පො.ස. (උ/පෙළ) හෝ ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පී NVQ 4 සහිත සිසුන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබයි. වාර්ෂික බඳවා ගැනීම් පුහුණුවන්නන් 20 කි.

මෙම වැඩසටහන සාර්ථකව නිම කරන අභ්‍යාසලාභීන්ට NVQ මට්ටමේ 5 සහතිකය පිරිනමනු ලැබේ.

2023 වර්ෂයේදී අභ්‍යාසලාභීන් 20 දෙනෙකු මෙම පාඨමාලාව සම්පූර්ණ කරන ලදී.

### 6.4.1.4 උසස් පෙළ වෘත්තීය විෂය ධාරා පුහුණු වැඩසටහන (වසර 13 සහතික කළ අධ්‍යාපනය)

සම්පූර්ණයෙන්ම රජයෙන් අරමුදල් සපයන උසස් පෙළ වෘත්තීය විෂය ධාරා පුහුණු වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව ක්‍රියාත්මක වේ. උසස් පෙළ අධ්‍යයන විෂය ධාරාව සඳහා සුදුසුකම් නොලබන බොහෝ සිසුන් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මෙම විෂය ධාරාවට යොමු කරනු ලැබේ. "ඉදිකිරීම් අධ්‍යයනය" තෝරාගත් සිසුන් ඉදිකිරීම් උපකරණ කාර්මික වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි. 2023 වසරේ මෙම විෂය ධාරාව යටතේ සිසුන් 49 දෙනෙකු ඉදිකිරීම් උපකරණ කාර්මික වැඩසටහන හදාරමින් සිටී.

### 6.4.1.5 සේවකයන්ගේ නිපුණතා උත්ශ්‍රේණිගත කිරීම

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීමෙහි නිරතව සිටින කාර්මිකයන්, අධීක්ෂකවරුන් සහ කළමනාකරුවන්ගේ තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. එක් එක් අභ්‍යාසලාභියා වෙත වෙන් වෙන් වශයෙන් අවධානය යොමු කිරීම සඳහා එක් කණ්ඩායමකට බඳවා ගැනීම් සංඛ්‍යාව12කට සීමා කර ඇත. මෙම පාඨමාලා හැදෑරීමට අදාළ ක්ෂේත්‍රවල ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

### 6.4.1.6 කනිෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කරන ස්ථානවල සේවය කරන කනිෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම හා නිපුණතා යාවත්කාලීන කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. මෙම පාඨමාලා හැදෑරීමට වසර දෙකේ සිට පහ දක්වා පළපුරුද්ද අවශ්‍ය වේ. සේවායෝජකයින්ට ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා මත ඕනෑම තෝරාගත් මොඩියුලයකට ඔවුන්ගේ කාර්මික ශිල්පීන් සහභාගි කරවීමට හැකි වන පරිදි පාඨමාලා විවිධ මොඩියුලවලට බෙදා ඇත. මෙම මොඩියුලවලින් සමහරක්, එනම් හයිඩ්‍රොලික්ස් සහ මෙකට්‍රොනික්ස්

මොඩියුල සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර සමහර විට මෙම මොඩියුල සඳහා අමතර පාඨමාලා ද පැවැත්විය යුතු වේ.

### 6.4.1.7 ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් (3 වන මට්ටම)

ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම සහ නිපුණතා යාවත්කාලීන කිරීම සහ දෝෂ හඳුනා ගැනීම සහ නිවැරදි කිරීම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සඳහා මෙම උසස් පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. වසර පහකට වැඩි පළපුරුද්දක් ඇති කාර්මික ශිල්පීන් මෙම පාඨමාලාවට සහභාගී වීමට සුදුසුකම් ලබයි.

මෙම පුහුණු පාඨමාලා සේවායෝජකයින්ට ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව ඕනෑම තෝරාගත් මොඩියුලයකට තම කාර්මික ශිල්පීන් සහභාගි කරවීමට හැකිවන පරිදි විවිධ මොඩියුල 6කින් සමන්විත වේ. හයිඩ්‍රොලික්ස් සහ මෙකට්‍රොනික්ස් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එබැවින් සමහර විට මෙම මොඩියුල සම්බන්ධයෙන් අමතර පාඨමාලා පැවැත්විය යුතු වේ.

### 6.4.1.8 අධීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම සඳහා වගකිව යුතු වැඩපොළ අධීක්ෂකවරුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා අධීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. මෙම පාඨමාලා සඳහා වසර දෙකක අදාළ පළපුරුද්ද ඇති අධීක්ෂකවරුන් බඳවා ගැනේ.

### 6.4.1.9 ඉංජිනේරුවන් / කළමණාකරුවන් සඳහා පුහුණු වැඩසටහන්





ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම සඳහා සම්බන්ධවන ඉංජිනේරුවන්, වැඩපොළ කළමනාකරුවන් හා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් නිර්මාණය කර ඇත. ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම පිළිබඳ සිවිල් ඉංජිනේරුවන් හා ව්‍යාපෘති කළමනාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා **ඉදිකිරීම් උපකරණ භාවිතය පිළිබඳ** පුහුණු පාඨමාලාව නිර්මාණය කර ඇත. වසර 02ක පළපුරුද්දක් තිබෙන ඉංජිනේරුවන් මෙම පාඨමාලාව සඳහා බඳවාගැනීම සිදු කරයි.**ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව**, ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු යාන්ත්‍රික ඉංජිනේරුවන්ට සහ ඉදිරිපෙළ කළමනාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සහභාගිවන්නන්ට වසර 02ක පළපුරුද්දක් තිබිය යුතුය.





### 6.4.1.10 සහායක කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අනෙකුත් අංශවල ඉල්ලුමට සරිලන පරිදි මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇත. මේ යටතේ, ගබඩා භාරකාරත්වය, ගබඩා කළමණාකරණය සහ ඉන්වෙන්ටරි පාලනය, වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය යනාදී පුහුණු වැඩසටහන් සිදු කිරීම සඳහා CETRAC හි ඇති මූලික පුහුණු පහසුකම් භාවිතා කෙරේ.

ඉලක්කගත කණ්ඩායම - කර්මාන්තයේ නියැලී සිටින ගබඩා භාරකරුවන්, කළමනාකරණ සහායකයින් සහ සහායක කාර්ය මණ්ඩලය

### 6.4.1.11 ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන්

ගොඩනැගිලි සේවා ඉංජිනේරු අංශයේ ඇති ඉල්ලුම මත පදනම්ව ඉංජිනේරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන් සහ කර්මාන්තයේ අනෙකුත් අදාළ ශ්‍රේණිවල වෘත්තිකයන්ගේ දැනුම සහ නිපුණතා යාවත්කාලීන කිරීම සඳහා මෙම වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒවායින් ගිනි ආරක්ෂණ පද්ධති, විදුලි පද්ධති, වායු සමීකරණ සහ සංවාතන පද්ධති, ජල සම්පාදන සහ ජලාපවහන පද්ධති යනාදිය ආවරණය කරයි.

### 6.4.1.12 පාරිභෝගිකයන් ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ සහ ඒ ආශ්‍රිත අංශවල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම වැඩසටහන් විශේෂයෙන් නිර්මාණය කර ඇත. පාරිභෝගිකයින් අලුතින් අත්පත් කරගත් ඉදිකිරීම් උපකරණ පිළිබඳව දැනුම්වත් කිරීම, ඉදිකිරීම් උපකරණවල හයිඩ්‍රොලික්, සම්ප්‍රේෂණ, මෙකට්‍රොනික්ස් සහ එන්ජින් පද්ධතිවල ගැටලු විසඳීම, දොඹකර සහ ෆෝක්ලිෆ්ට් ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම්වත් කිරීම ජනප්‍රිය ක්ෂේත්‍ර කිහිපයකි. ඉදිකිරීම් උපකරණ නඩත්තුව පිළිබඳ අලුතින් හඳුන්වා දුන් ඩිප්ලෝමා වැඩසටහන ද මේ යටතේ ඇතුළත් වේ.

### 6.4.1.13 වැඩපොළ සහ සම්මන්ත්‍රණ

ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරින්, අධීක්ෂකවරුන්, කාර්මික ශිල්පීන්, රියැදුරන් සහ සහායකයින් සඳහා නවීන මෝටර් රථ තාක්ෂණය, විද්‍යාත්මක සහ ආරක්ෂිත රිය පැදවීම, ඉදිකිරීම් උපකරණ හඳුන්වාදීම වැනි සම්බන්ධිත මාතෘකා සහ ඉදිකිරීම් උපකරණ කළමනාකරණය, නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම

ආවරණය වන පරිදි එම විෂය ක්ෂේත්‍රවල ඉල්ලුම මත පදනම්ව එක් දින හෝ දෙදින වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වන ලදී.
ඉලක්කගත කණ්ඩායම - ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන්, අධීක්ෂකයන්, කාර්මිකයන්, රියදුරන් සහ සහායකයින්

**6.4.1.14 වැඩපොළ රැකියා, වාණිජ පරීක්ෂණ, උපකරණ කුලියට ගැනීම සහ වෙනත් විවිධ රැකියා**

CETRAC ආදර්ශ වැඩපොළෙහි ඇති ට්‍රැක් ප්‍රෙස්, රෝලර සෑදීම සඳහා ගිල් වූ ආර්ක් වෙල්ඩින් යන්ත්‍රය වැනි විශේෂ පහසුකම් භාවිතා කරමින් ඉදිකිරීම් උපකරණ අංශයේ අලුත්වැඩියා සහ නඩත්තු සේවා මෙම කාණ්ඩය යටතේ සිදු කරන ලදී. මීට අමතරව කර්මාන්ත පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම සහ උපකරණ කුලියට දීම ද මෙම කාණ්ඩය යටතේ සිදු කෙරේ

**6.4.1.15 පහසුකම් කුලියට දීම**

CETRAC පහසුකම් අභ්‍යන්තර වැඩසටහන් සඳහා භාවිතා නොකරන සෑම අවස්ථාවකදීම ඒවා ආදායම් උත්පාදනය සඳහා කුලියට දෙනු ලැබේ. වායු සමීකරණය සහිත ගොඩනැගිලි පහසුකම්වලට එක් දේශන ශාලාවක්, සම්මන්ත්‍රණ ශාලා 02ක් සහ පන්ති කාමර 03ක් ඇතුළත් වේ. වායු සමීකරණය කළ/නොකළ කාමර සහ ආපනශාලා පහසුකම් සහිත නේවාසිකාගාර, නේවාසික වැඩසටහන් සඳහා ප්‍රයෝජනවත් වේ.
ඉලක්කගත කණ්ඩායම - වැඩමුළු, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ආදිය පවත්වන රාජ්‍ය/රාජ්‍ය නොවන සංවිධාන.

**6.4.2 විශේෂ වැඩසටහන්**

**6.4.2.1 ක්‍රියාත්මක කිරීම මඟින් ඉදිකිරීම් යාන්ත්‍රිකකරණයේ තිරසරත්වය සඳහා නිපුණතා සංවර්ධනය**

නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන (SSDP) සමඟ නම්‍යශීලී ඉගෙනුම් ආකෘතිය (FLM) මත මෙම වැඩසටහන පදනම් වේ.

මෙම වැඩසටහන මඟින් රැකියාවල නියුක්ත පුද්ගලයන් 23 දෙනෙකු ඉදිකිරීම් කර්මාන්තයේ තිරසරකත්වය සඳහා ඉදිකිරීම් උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීමේ ක්ෂේත්‍රයේ ඉහළ-නිපුණතා හෝ ප්‍රති-නිපුණතා පිළිබඳ නිපුණතා ලබා ගන්නා ලදී. මෙම වැඩසටහන මඟින්, නිපුණතා අංශ සංවර්ධන වැඩසටහනෙහි (SSDP) ආධාර ප්‍රදාන යටතේ පෞද්ගලික අංශයේ දැනට සිටින ශ්‍රම බලකායේ ප්‍රති-නිපුණතා සහ ඉහළ-නිපුණතා වැඩි දියුණු කිරීම සිදු කරන ලදී.

**6.4.2.2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා ඉදිකිරීම් උපකරණ පුහුණු වැඩසටහන**

සිසුන්ට වෙන් වෙන් වශයෙන් පුහුණුව ලබා දීම සහ ඉදිකිරීම් උපකරණ මෙහෙයුම් පිළිබඳ නිපුණතා ලබා ගැනීම සහ යන්ත්‍ර නඩත්තුව පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙම වැඩසටහන යටතේ උපාධි අපේක්ෂකයින් 27 දෙනෙකු පුහුණු කරන ලදී.

2023 වර්ෂයේ CETRAC කාර්ය සාධනය පහත පරිදි වේ.

6.4.1වගුව: 2023 **වර්ෂයේ** CETRAC **කාර්ය සාධනය**

| | **පුහුණු වැඩසටහන්** | **ඉලක්කය** | | **ප්‍රතිදානය** | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
| 1 | පාසල් හැරයන්නන් සඳහා (මට්ටම 1) ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව (CEM) | 2 | 120 | 2 | 120 |
| **2** | උසස් පෙළ වෘත්තීය පුහුණු වැඩසටහන (වසර 13ක අධ්‍යාපනය) | 1 | 50 | 1 | 49 |
| **3** | ඉදිකිරීම් නඩත්තු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (NVQ 5) | 1 | 20 | 1 | 26(2nd batch) |
| | **පුහුණු පාඨමාලා** | **ඉලක්කය** | | **ප්‍රතිදානය** | |
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
| **4** | **කාර්මිකයින් (මට්ටම II)** | | | | |
| | හයිඩ්‍රොලික් පද්ධති නඩත්තු කිරීම (05 Days) | 1 | 15 | 1 | 9 |
| | ජල පොම්ප සහ සම්පීඩක නඩත්තු කිරීම | 1 | 15 | 1 | 18 |
| | හයිඩ්‍රොලික් පද්ධති නඩත්තු කිරීම (10 Days) | 1 | 15 | 1 | 16 |
| | ඉදිකිරීම් උපකරණවල ඉලෙක්ට්‍රොනික හා මෙකට්‍රොනික නඩත්තුව | 1 | 15 | 1 | 8 |
| | ඉදිකිරීම් උපකරණ සර්විස් කිරීම | 1 | 15 | 1 | 2 |
| | නම්‍යශීලී ඉගෙනුම් ආකෘතිය -FLM | 1 | 15 | 1 | 13 |
| **5** | **සහායක කාර්ය මණ්ඩලය** | | | | |
| | ආයතනික ගබඩා කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, සත්‍යායනය කිරීම, බැහැර කිරීමේ ක්‍රියා පටිපාටිය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය. | 2 | 40 | 2 | 41 |
| | ආයතනික ප්‍රවාරක සහ සැපයුම් දාම කළමනාකරණය | 1 | 20 | 1 | 36 |
| **6** | **අභිරුචිකරණය කළ පාඨමාලා (CET)** | | | | |
| | උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන (KDU) | 1 | 27 | 1 | 27 |
| | ෆෝක්ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව | 12 | 72 | 12 | 107 |
| **7** | **ගොඩනැගිලි සේවා ඉංජිනේරු (BSE)** | | | | |
| | ඩීසල් ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම | 1 | 20 | 1 | 22 |
| | උස් ගොඩනැගිලි සඳහා සක්‍රිය සහ අක්‍රිය ගිනි ආරක්ෂණ පද්ධති | 1 | 20 | 1 | 67 |
| | CCTV පද්ධතිවල සැලසුම් අංග | 1 | 20 | 1 | 17 |
| | බෙදුම්/කැසට් වර්ගයේ වායු සමීකරණ ඒකක නඩත්තු කිරීම- කොමර්ෂල් ඩිවලොප්මන්ට් කම්පැනි PLC | 1 | 5 | 1 | 5 |
| | ගොඩනැගිලි සඳහා විදුලි පද්ධතිය සැලසුම් කිරීම | 1 | 15 | 1 | 12 |
| | සූර්ය PV පද්ධති පිළිබඳ වැඩමුළුව | 1 | 20 | 1 | 34 |
| | උස් ගොඩනැගිලි සඳහා ජලනල පද්ධති | 1 | 20 | 1 | 8 |
| | බෙදුම්/කැසට් වර්ගයේ වායු සමීකරණ ඒකක නඩත්තු කිරීමේ පුහුණු වැඩසටහන | 1 | 12 | 1 | 8 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **8** | **වැඩමුළු සහ සම්මන්ත්‍රණ** | | | | |
| | ජංගම දොඹකර පිළිබඳ දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන | 1 | 20 | 1 | 20 |
| | ආරක්ෂිත, විද්‍යාත්මක සහ සකසුරුවම් රිය පැදවීම | 4 | 120 | 1 | 143 |
| | ඉදිකිරීම් උපකරණ තෝරාගැනීම සහ නඩත්තු කළමනාකරණය | 1 | 20 | 2 | 15 |
| | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතිකය | 1 | 15 | 1 | 22 |
| | ආරක්ෂිත, විද්‍යාත්මක සහ සකසුරුවම් රිය පැදවීම - රෙජිස්ටාර් ජෙනරල් දෙපාර්තමේන්තුව | 1 | 17 | 1 | 17 |
| | ආරක්ෂිත, විද්‍යාත්මක සහ සකසුරුවම් රිය පැදවීම - සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව | 1 | 22 | 1 | 22 |
| | රියදුරන්ගේ වෘත්තීය දැනුවත්භාවය සහ ආකල්ප වර්ධනය කිරීම - LECO | 1 | 40 | 1 | 39 |
| | ආරක්ෂිත, විද්‍යාත්මක සහ සකසුරුවම් රිය පැදවීම - LECO | 1 | 20 | 1 | 16 |
| | වෘත්තිමය රියදුරෙකු වන්නේ කෙසේද - LECO | 1 | 20 | 1 | 16 |
| | **එකතුව** | **46** | **865** | **43** | **955** |

### 6.4.3 බර වාහන පුහුණු විද්‍යාලය (OTC) - වැඩසටහන්

අභ්‍යාසලාභීන්ට ප්‍රායෝගික නිපුණතා ලබා දීම සඳහා පුහුණු කාලයෙන් 70%ක් පමණ ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන් කරනු ලබන අතර ඉතිරි 30% න්‍යායයට සීමා වේ. අභ්‍යාසලාභීන්ට රැකියා පුහුණුව ලබා දෙමින් ආදායම් උත්පාදනය සඳහා සමහර ඉදිකිරීම් උපකරණ කුලියට දෙනු ලැබේ.
ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු විද්‍යාලය මගින් ක්රෝලර් ට්‍රැක්ටර්, ලෝඩර්, එක්ස්කැවේටර් යන්ත්‍ර, මෝටර් ග්‍රේඩර් ආදී ඉදිකිරීම් උපකරණවල ආරක්ෂාව, මූලික නඩත්තුව සහ මෙහෙයුම් ක්‍රමවේදයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් පුහුණුව ලබා දේ. OTC සතුව ඉදිකිරීම් උපකරණ 50ක ඇණියක් සහ පුහුණු නිලධාරින් සහ ප්‍රදර්ශනය කරන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇත.

අභ්‍යාසලාභීන්ට ප්‍රායෝගික නිපුණතා ලබා දීම සඳහා පුහුණු කාලයෙන් 70%ක් පමණ ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන් කරනු ලබන අතර ඉතිරි 30% න්‍යායයට සීමා වේ. අභ්‍යාසලාභීන්ට රැකියාස්ථ පුහුණුව ලබා දෙන අතරම ආදායම් උත්පාදනය සඳහා සමහර ඉදිකිරීම් උපකරණ කුලියට දෙනු ලැබේ. OTC පුහුණු වැඩසටහන් ඉහත සඳහන් කළ පරිදි ආයතනික පුහුණුව සහ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක වනවිට රැකියාස්ථ පුහුණුවෙන් සමන්විත වේ. ආයතනික පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු අවම වශයෙන් මාස හයක රැකියාස්ථ පුහුණුවක් ලබා ගන්නා අභ්‍යාසලාභියෙකු NVQ මට්ටම 4 සඳහා සුදුසුකම් ලබයි. ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා NVQ පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම සඳහා NAITA විසින් OTC පිළිගනු ලැබේ.

**6.4.3.1 මූලික පුහුණුව**

1. **මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තුව**

කරදරවලින් තොර, අඩු පිරිවැය සහිත විශ්වාසදායක ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා නිෂ්පාදකයාගේ උපදෙස් සහ ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතා සංවර්ධනය කර ඇත.

**2. උසස් පෙළ වෘත්තීය විෂය ධාරා පුහුණු වැඩසටහන (වසර 13ක සහතික කළ අධ්‍යාපනය)**

සම්පූර්ණයෙන්ම රජයෙන් අරමුදල් සපයන උසස් පෙළ වෘත්තීය විෂය ධාරා පුහුණු වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය හා සහයෝගිත්වයෙන් ක්‍රියාත්මක වේ. උසස් පෙළ අධ්‍යයන විෂය ධාරාව සඳහා සුදුසුකම් නොලබන බොහෝ සිසුන් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මෙම විෂය ධාරාවට යොමු කරනු ලැබේ. "ඉදිකිරීම් අධ්‍යයනය" තෝරාගත් සිසුන් ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු වැඩසටහන් සඳහා සුදුසුකම් ලබයි. 2023 වර්ෂයේ දී මෙම විෂය ධාරාව යටතේ සිසුන් 94 දෙනෙකු ක්‍රියාකරු පුහුණු වැඩසටහන් සම්පූර්ණ කර ඇත.

**නිපුණතා සංවර්ධන අංශ**

3.1 සැහැල්ලු ඉදිකිරීම් උපකරණ - (Light construction Equipment Operator)
3.2 ඩම්ප් ට්‍රක් - (Dump truck operator)
3.3 ෆාම් ට්‍රැක්ටර් - (Farm tractor operator)
3.4 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් වයිබ්‍රේටර් රෝලර් - (Self propelled vibrating roller operator)
3.5 ක්‍රොලර් ට්‍රැක්ටර් - (Crawler tractor operator)
3.6 වීල් ලෝඩර් - (Wheel loader operator)
3.7 මෝටර් ග්‍රේඩර් - (Motor grader operator)
3.8 හයිඩ්‍රොලික් එක්ස්කැවේටර් - (Hydraulic excavator operator)
3.9 බැකෝ ලෝඩර් - ( Backoe loader operator )
3.10 ස්කිඩ් ස්ටියර් ලෝඩර් - (Skid steer loader operator)
3.11 මොබයිල් ක්‍රේන් - (Mobile crane operator)
3.12 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර් - (Plant tansporter operator)
3.13 ෆෝක් ලිෆ්ට් ට්‍රක් - (Fork lift truck operator)
3.14 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන් - (Truck Mounted Crane operator)

**6.4.3.2 වෘත්තීය පරීක්ෂණ**

3.1 සිට 3.14 දක්වා සියලුම පුහුණු වැඩසටහන් ගාස්තු අය කරන පාඨමාලා වන අතර ඒවායින් සමහරක් පාසල් හැර ගිය අය, විදේශීය රැකියා අපේක්ෂිත සහ රැකියා විරහිත තරුණ තරුණියන් අතර ඉහළ ඉල්ලුමක් පවතී.

**3. පුනරුත්ථාපනය වූ තරුණයින් බැකෝ ලෝඩර් ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම**

පුනරුත්ථාපන කාර්යාංශයේ සහයෝගීත්වයෙන් මෙම වැඩසටහන සේනපුර සහ කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ. ඉදිකිරීම් ක්ෂේත්‍රයට දායක වෙමින් පුනරුත්ථාපනය වූ තරුණ තරුණියන් සමාජ වගකීම් සහිත සහ ඵලදායී පුරවැසියන් ලෙස යොමු කිරීම කෙරෙහි මෙහි අවධානය යොමු කෙරේ.

4. **වෘත්තීය පරීක්ෂණ**

5.1 NVQ පරීක්ෂණ

5.2 ඉල්ලුම මත පවත්වන නිපුණතා පරීක්ෂණ

5. **අභිරුචිකරණය කරන ලද පුහුණු වැඩසටහන්**

අභිරුචිකරණය කරන ලද පුහුණු වැඩසටහන් යනු ඔවුන්ගේ අවශ්‍යතා මත ආයතනවල ඉල්ලීම් සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති පුහුණු වැඩසටහන් වේ. 2023 වසරේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා ක්‍රියාකරු පුහුණු දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 2023 දී ශ්‍රී ලංකා ටෙලිකොම් සඳහා ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන් සහ ඕගර් ඔපරේටර් පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී.

**6.4.3.3 පුහුණු ප්‍රතිදානය 2023**

එක් එක් පුහුණු කාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියාකරු පුහුණු සාක්ෂාත් කර ගැනීම් පහත වගුවේ දක්වා ඇත.
*(කරුණාකර වගුව 1 බලන්න)*

| | පුහුණු වැඩසටහන | **2023 ප්‍රතිදානය** | |
|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවන්නන් සංඛ්‍යාව |
| **1.0** | මූලික පුහුණුව | | |
| | 1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තුව | 12 | 222 |
| **2.0** | නිපුණතා සංවර්ධන | | |
| | 2.1 උසස් පෙළ වෘත්තීය විෂය ධාරා පුහුණු වැඩසටහන (වසර 13ක සහතික කළ අධ්‍යාපනය). | 01 | 94 |
| | 2.2 පුනරුත්ථාපනය වූ තරුණයින් බැකෝ ලෝඩර් ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම | 05 | 100 |
| | 2.3 සම්මත ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු වැඩසටහන් | 31 | 337 |
| | එකතුව | 47 | 531 |

6.4.2 *වගුව*: 2023 *පුහුණු ප්‍රතිදානය*

**6.4.3.4 පුහුණු යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීම**

තාක්ෂණයේ දියුණුවත් සමඟ, නව ඉදිකිරීම් උපකරණ ද උසස් පාලන පද්ධති සහ වැඩි ක්‍රියාරිත්වය සමඟ පැමිණේ. ක්‍රියාකරුවන්ට එම නවීන උපකරණ පිළිබඳ දැනුම සහ නිපුණතා අවශ්‍ය වේ. එබැවින්, OTC සිය ඉදිකිරීම් උපකරණ ඇණිය නවීන තාක්ෂණය සමඟ යාවත්කාලීන කරයි. එක් ඒකකයක යන්ත්‍ර මොඩියුල හතරක් සහිත යාවත්කාලීන ක්‍රියාකරු පුහුණු වැඩසටහන් සඳහා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු සිමියුලේටරයක් ප්‍රසම්පාදනය කෙරෙමින් පවතී. සිමියුලේටරය මඟින් පුහුණු කිරීමේ පිරිවැය අඩු කරන අතරම විවිධ පුහුණු අභ්‍යාස සපයයි.

**6.4.3.5 භූමි වැඩ ව්‍යාපෘති, අභිරුචිකරණය කළ වැඩසටහන් පැවැත්වීම සහ යන්ත්‍රසූත්‍ර කුලියට දීම**

ඉදිකිරීම් උපකරණ කුලියට දීම ක්‍රියාකරු පුහුණු විද්‍යාලය විසින් සපයනු ලබන අතිරේක සේවාවකි. එමඟින් විද්‍යාලයට අමතර ආදායමක් ද ලැබේ. පවතින යන්ත්‍ර ඇණිය භාවිතා කිරීමේදී පුහුණුව සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර පුහුණු කටයුතු සඳහා යොදා නොගන්නා යන්ත්‍ර ඇති විට ඒවා කුලියට දෙනු ලැබේ.

**6.4.4 උත්පාදනය කරන ලද ආදායම**

OTC මඟින් උපයාගත් ආදායම රු. 34,466,476.00 කි.

### 6.5 මානව සම්පත් සහ පරිපාලන අංශය

2023 වර්ෂයේ දී මානව සම්පත එලදායී හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමෙන් උපාය මාර්ගික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

2023 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම් වන්නේ,

#### 6.5.1 පුරප්පාඩු පිරවීම

අත්‍යාවශ්‍ය තනතුරු 30ක් පිරවීම සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත් අතර ජාතික පුවත්පත් සහ CIDA වෙබ් අඩවිය හරහා ත්‍රිභාෂාවෙන් අයදුම්පත් කැඳවන ලදී. 2023 දෙසැම්බර් මාසය තුළ පත්වීම් තුනක් ලබා දී ඇත.

#### 6.5.2 අභ්‍යන්තර උසස්වීම්

අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට (SOR) අනුව මූලික අවශ්‍යතා සපුරා ඇති සේවකයක් 19 දෙනෙක් ඔවුන්ගේ ඊළඟ ශ්‍රේණිවලට උසස් කරන ලදී.

#### 6.5.3 ස්ථිර කිරීමේ ලිපි නිකුත් කිරීම

පරිවාස කාලය සම්පූර්ණ කර ඇති සහ SOR හි මූලික අවශ්‍යතා සපුරා ඇති සේවකයින් සඳහා ස්ථිර කිරීමේ ලිපි 33 ක් නිකුත් කරන ලදී.

#### 6.5.4 ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්

ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සේවකයින් 201 දෙනෙකු සඳහා ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීමට CIDA ට හැකි විය.

#### 6.5.5 පාරිතෝෂික ගෙවීම්

CIDA හි සේවයෙන් විශ්‍රාම ගිය/ඉවත් වූ සේවකයන් 15ක් ඔවුන් විශ්‍රාම යැමෙන්/ඉල්ලා අස්වීමෙන් දින 30ක් ඇතුළත ඔවුන්ගේ අදාළ කාල සීමාව සඳහා පාරිතෝෂිකය ප්‍රමාදයකින් තොරව ගෙවා ඇත.

#### 6.5.6 CIDA කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය කිරීම

විවිධ පුහුණු ආයතන මඟින් ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් 13 ක් පවත්වන ලද අතර 2023 වර්ෂයේදී ඒ සඳහා නිලධාරීන් 125 දෙනෙකු සහභාගී විය. එම සංඛ්‍යාව ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ කාර්ය මණ්ඩලය, කළමනාකාර මට්ටමේ කාර්ය මණ්ඩලය, කනිෂ්ඨ කළමනාකාර, කළමනාකරණ සහකාර (තාක්ෂණ) සහ (තාක්ෂණික නොවන) කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| අනු අංකය | වැඩසටහනේ නම | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය | 02 |
| 02 | Quick Book පරිගණකගත ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| 03 | අභ්‍යන්තර විගණන පරිචයන් පිළිබඳ පුහුණු වැඩසටහන | 02 |
| 04 | කාර්යාල කළමනාකරණය සහ මූල්‍යමය නියාමනය | 06 |
| 05 | සහායක වෘත්තීය පුහුණු (APT) වැඩසටහන | 03 |
| 06 | ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය | 76 |
| 07 | ආයතනික ක්‍රියාපටිපාටි | 05 |
| 08 | ප්‍රවාහන කළමනාකරණය | 03 |
| 09 | ආරක්ෂක මුරකරුවන් සහ නිලධාරීන් සඳහා රාජකාරි, වගකීම් සහ ආචාර ධර්ම | 02 |
| 10 | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය | 02 |
| 11 | මූල්‍ය විශ්ලේෂණය සහ පුරෝකථන | 01 |
| 12 | විනය කළමනාකරණය | 02 |
| 13 | රජයේ නිලධාරීන් දැන සිටිය යුතු නීතිය | 20 |

6.5.1 වගුව: පුහුණු වැඩසටහන් සහ සහභාගිවූවන්

### 6.5.7 CSR ක්‍රියාකාරකම්

CIDA විසින් 2023 වසර තුළ NAITA හි ආධුනිකයන් 08 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා ලබා දී ඇත.

### 6.5.8 කාර්ය මණ්ඩල තොරතුරු

2023 වර්ෂයේදී මුළු ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාව 214කි. මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 15ක් පිරවීමට නියමිතව පවතී. ඊට අමතරව කනිෂ්ඨ කළමනාකාර තනතුරු 32ක් සහ ද්විතීයික මට්ටමේ තනතුරු 37ක් පුරප්පාඩු වී ඇත.

| තනතුරු නාමය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | HM 2-1 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 6 | 4 | 2 |
| සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | 29 | 14 | 15 |
| **එකතුව** | | **36** | **19** | **17** |
| **තෘතීයික මට්ටම** | | | | |
| කණිෂ්ඨ කළමනාකරු | JM 1-2 | 71 | 39 | 32 |
| **එකතුව** | | **71** | **39** | **32** |
| **ද්විතීයික මට්ටම** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 (තාක්ෂණික නොවන) | 80 | 63 | 17 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | MA 2-2 (තාක්ෂණික ) | 34 | 14 | 20 |
| **එකතුව** | | **114** | **77** | **37** |
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික මට්ටම (පුහුණු) | PL-3 (පුහුණු) | 80 | 41 | 39 |
| ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු) | PL-2 (අර්ධ පුහුණු) | 10 | 6 | 4 |
| ප්‍රාථමික මට්ටම (නුපුහුණු) | PL-1 (නුපුහුණු) | 37 | 26 | 11 |
| එකතුව | | **127** | **73** | **54** |
| **ආරක්ෂක කාර්ය මණ්ඩලය නොමැතිව මුළු එකතුව** | | **348** | **208** | **140** |
| **ආරක්ෂක අංශය*** | | | | |
| ආරක්ෂක නිලධාරි/අධීක්ෂක | MA 1-2 (තාක්ෂණික නොවන) | 9 | 1 | 8 |
| මුරකරු | PL-1 (නුපුහුණු) | 33 | 5 | 28 |
| **එකතුව** | | **42** | **6** | **36** |
| **මුළු එකතුව** | | **390** | **214** | **176** |

6.5.2 වගුව: කාර්ය මණ්ඩල තොරතුරු

**සටහන: තනතුර දරන්නාට පමණක් අදාළ වේ (ආරක්ෂක කාර්ය මණ්ඩලය)*

2023.01.01 සිට 2023.12.31 දක්වා විශ්‍රාම ගැන් වූ, ඉල්ලා අස් වූ සහ තනතුර හැර ගිය සේවකයින්ගේ විස්තර.

**සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු (විශ්‍රාම ගැන් වූ, ඉල්ලා අස් වූ, තනතුර හැර ගිය)**

| | |
|---|---|
| විශ්‍රාම ගැන් වූ | 11 |
| ඉල්ලා අස් වූ | 08 |
| තනතුර හැර ගිය | 01 |
| එකතුව | **20** |

**2023 වර්ෂයේදී විශ්‍රාම ගැන් වූ/ඉල්ලා අස් වූ, තනතුර හැර ගිය සේවකයන්ගේ විස්තර**

| අනු අංකය | සේවක කේතය | සේවකයාගේ නම | තනතුර | වැටුප් කේතය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| විශ්‍රාම ගැන් වූ ලැයිස්තුව | | | | | |
| 01 | 542 | එච්.පී. කුලතුංග මහතා | සහකාර අධ්‍යක්ෂ (ශිල්පී පුහුණු ඇගයීම්) | MM 1-1 | |
| 02 | 268 | ඩී.කේ.පී ගම්ලත්ගේ මහතා | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | I |
| 03 | 312 | ඩබ්ලිව්.ඒ.එම්.මංගලිකා මිය | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | I |
| 04 | 181 | කේ.ජී.එන් චන්ද්‍රිකා මිය | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | I |
| 05 | 476 | වයි.ජී.එම්.එස්.බණ්ඩා මහතා | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | I |
| 06 | 214 | බී.ඒ.ජී ජයතුංග මහතා | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | I |
| 07 | 180 | පී.එච්.තිලකරත්න මහතා | ජ්‍යෙෂ්ඨ මුරකරු | MA 1-2 | I |
| 08 | 289 | ඒ.ඒ.එම් ප්‍රියංකර මහතා | රියදුරු | PL - 3 | I |
| 09 | 559 | ටෝනි විදානගේ මහතා | ප්‍රදර්ශක | PL - 3 | I |
| 10 | 259 | එස්.පී.එම් තිලකවංශ මහතා | වඩු කාර්මික ශිල්පී | PL - 3 | I |
| 11 | 292 | එස්.ඒ.සී.කරුණාසේන මහතා | ප්‍රදර්ශක | PL - 3 | I |
| | | | | | |
| ඉල්ලා අස් වූ ලැයිස්තුව | | | | | |
| 01 | 991 | ටී වී සෙම්බුකුට්ටිආරච්චි මහතා | අධ්‍යක්ෂ (මුදල්) | HM 1-3 | |
| 02 | 384 | ඒ.ඒ.බී.සී.එල්.ඒ.මැණිකේ මිය | අළෙවිකරණ නිලධාරි | JM 1-2 | II |
| 03 | 1026 | එන්.සී.ඩී උපනන්ද මිය | තාක්ෂණික සහකාර | MA 2-2 | III |
| 04 | 1030 | බී.අයි.ඒ.පෙරේරා මිය | තාක්ෂණික සහකාර | MA 2-2 | III |
| 05 | 959 | මධුෂාන් මහතා එච්.කේ.එච් | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | III |
| 06 | 374 | කේ.කේ.ආර්.එම් පොඩිමැණිකේ මිය | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | I |
| 07 | 263 | ආර්.එම් විජේසිංහ මහතා | රියදුරු | PL - 3 | I |
| 08 | 945 | ඩබ්ලිව්.ඒ.එන්.දිනේෂ් මහතා | රියදුරු | PL - 3 | I |
| | | | | | |
| තනතුර හැර ගිය | | | | | |
| 01 | 1013 | කේ.ඒ.එස්.එස් චන්ද්‍රසේන මිය | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-2 | III |
| | | | | | |

6.5.3 වගුව: විශ්‍රාම ගැන් වූ/ඉල්ලා අස් වූ/තනතුර හැර ගිය

### 6.5.9 2023 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන කාර්යයන්

2023 වර්ෂයේදී, මානව සම්පත් හා පරිපාලන අංශයේ විෂය පථය යටතේ පවතින සැපයුම් ඒකකය මඟින් පහත සඳහන් ප්‍රධාන ප්‍රසම්පාදන කාර්යයන් සිදු කරන ලදී.

| මිලදී ගත් දිනය | අයිතමය | වටිනාකම (රු.) | සේවාදායකයා | තත්ත්වය |
|---|---|---|---|---|
| 2024.01.03 | පුහුණු කටයුතු සඳහා භාවිතා කරන සිමියුලේටරය - OTC | 18,900,000.00 | OTC | ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර ඇත |

### 6.5.10 පහසුකම් කුලියට දීමෙන් උපයන ලද ආදායම

2023 වර්ෂයේ ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු කාමර සහ කතරගම සංචාරක බංගලාව කුලියට දීමෙන් උපයන ලද ආදායම රු. 1,706,694.57 කි.

### 6.5.11 උත්පාදනය කරන ලද මුළු ආදායම

මානව සම්පත් හා පරිපාලන අංශය මඟින් උපයන ලද ආදායම රු. 9,814,658.00 කි.

## 6.6 මූල්‍ය අංශය



### 6.6.1 හැඳින්වීම

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) මූල්‍ය අංශය අධිකාරියේ මෙහෙයුම්වල මූල්‍ය විශ්වසනීයත්වය සහ තිරසර බව සහතික කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය අංශය සිය විධිනියෝගය ක්‍රියාවට නැංවීමේදී මූල්‍ය සැලසුම්කරණය, අයවැයකරණය, ගිණුම්කරණය සහ ආයෝජන කළමනාකරණය ඇතුළු තීරණාත්මක කාර්යයන් රාශියක් භාර ගනී. CIDA හි සමස්ත සාර්ථකත්වය සඳහා එහි දායකත්වය ඉස්මතු කරමින් 2023 මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ මෙම සටහනෙහි සංක්ෂිප්තව දක්වා ඇත.

*ප්‍රධාන කාර්යයන්*

CIDA හි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය මූලික කාර්යයන් කිහිපයක් මූල්‍ය අංශය වෙත පැවරී ඇත. ඒවා නම්:

1. **මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම**: නිරවද්‍යතාවය, විනිවිදභාවය සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරමින්, අංශය විසින් මාසික සහ වාර්ෂික ගිණුම් ඉතා පරීක්ෂාකාරීව සකස් කරයි.

2. **අයවැයකරණය**: එය උපාය මාර්ගික ප්‍රමුඛතා සහ මෙහෙයුම් අවශ්‍යතා සමඟ මූල්‍ය සම්පත් පෙළගස්වමින් වාර්ෂික අයවැය සම්පාදනය කිරීමට මූලිකත්වය දෙයි.

3. **ගෙවීම් සැකසීම**: කාර්ය මණ්ඩල වැටුප්, විකුණුම්කරුවන් වෙත කළ යුතු ගෙවීම් සහ රජයේ බදු ඇතුළු අනෙකුත් මූල්‍ය ගෙවීම් කාලෝචිත හා නිවැරදිව සැකසීම සඳහා අංශය වගකීම දරයි.

4. **රජයේ විගණන සම්බන්ධීකරණය**: ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සහ වගවීම පෝෂණය කරමින් එය රජයේ විගණකවරුන් සමඟ බාධාවකින් තොරව සම්බන්ධීකරණය කිරීමට පහසුකම් සපයයි,

5. **කළමනාකරණ වාර්තාකරණය**: දැනුම්වත් තීරණ ගැනීම සහ කාර්ය සාධන අධීක්ෂණය සබල කරමින්, ඉදිරි දැක්මක් සහිත කළමනාකරණ තොරතුරු වාර්තා මෙම අංශයෙන් සකස් කරයි.

### 6.6.2 මූල්‍ය පහසුකම් සැපයීම

CIDA හි විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා ආධාර කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම මූල්‍ය අංශයේ විධිනියෝගයේ අනිවාර්ය අංගයකි. අනුමත අයවැය සහ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව, ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් මුලපිරීම් සඳහා මූල්‍ය සම්පත් පැවතීම මෙම අංශය මඟින් සහතික කෙරේ. ස්ථාපිත මාර්ගෝපදේශ සහ නියාමන රාමුවලට අනුකූලව අනුමත ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා දීම මෙයට ඇතුළත් වේ.

### 6.6.3 මූල්‍ය කළමනාකරණය සහ වාර්තාකරණය

මූල්‍ය අංශය CIDA හි අරමුදල්වල භාරකරු ලෙස කටයුතු කරන අතර, ඒවායේ විචක්ෂණ කළමනාකරණය සහ භාවිතය අධීක්ෂණය කරයි. එය වියදම් රටා සහ ව්‍යාපෘති ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම සඳහා මූල්‍ය හා ප්‍රගති වාර්තා සැකසීම ඇතුළුව විස්තීර්ණ මූල්‍ය වාර්තා පවත්වාගෙන යයි. තවද, ඒවායේ වටිනාකම ආරක්ෂා කරමින් සහ ආයෝජන මත ප්‍රතිලාභ ප්‍රශස්ත කරමින් අංශය CIDA හි වත්කම් කළමනාකරණය කරයි.

#### *6.6.3.1 කාර්ය සාධන විශේෂතා:*

2023 මූල්‍ය වර්ෂයේදී මූල්‍ය අංශය පහත සඳහන් වැදගත් අවස්ථා සාක්ෂාත් කර ගන්නා ලදී.

1. **වාර්තා තබා ගැනීම සහ පාලනය:** එකතුව රු.මි. 104.96 ක් වූ රජයේ ප්‍රදාන ඇතුළුව කාර්යක්ෂමව කළමනාකරණය කරන ලද මුළු ආදායම රු.මි.503.15 කි. මීට අමතරව, මූල්‍ය මෙහෙයුම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් රු.මි. 1,292 ක් වටිනා මුළු වත්කම්වල අධීක්ෂණය පවත්වා ගෙන යනු ලැබේ.

2. **මෙහෙයුම් අතිරික්තය:** දූරදර්ශී මූල්‍ය කළමනාකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබිඹු කරමින් රු.මි. 26.87 ක මෙහෙයුම් අතිරික්තයක් උත්පාදනය කරන ලදී.

3. **ඒකාබද්ධ අරමුදලට දායකත්වය:** ජාතික සංවර්ධන අරමුණු සඳහා CIDA හි කැපවීම අවධාරනය කරමින් ඒකාබද්ධ අරමුදලට රු.මි. 45ක දායකත්වයක් දක්වන ලදී.

***අනාගත දැක්ම:***

ඉදිරිය දෙස බලන විට, මූල්‍ය අංශය CIDA තුළ මූල්‍ය පාලනය, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කැපවී සිටී. CIDA හි උපායමාර්ගික අරමුණු සඳහා සහාය වීම සඳහා මූල්‍ය ක්‍රියාවලීන් තවදුරටත් විධිමත් කිරීම, තාක්ෂණික නවෝත්පාදනයන් සඳහා අනුබල දීම සහ අවදානම් කළමනාකරණ රාමු ශක්තිමත් කිරීම මෙහි අරමුණයි. මූල්‍ය විනය සහ භාරකාරත්වය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින්, ඉදිකිරීම් කර්මාන්තයේ තිරසර වර්ධනයට සහ ඔරොත්තු දීමේ හැකියාවට දායක වීමට අංශය උත්සාහ කරයි.

### 6.6.4 උත්පාදනය කරන ලද ආදායම

මූල්‍ය අංශයෙන් උපයා ඇති ආදායම රු. 39,967,599.00 කි.

# 7.0 ඇමුණුම 1- වාර්ෂික ක්‍රියාවට නැංවීමේ සැලැස්ම -2023

# කර්මාන්ත සේවා අංශය

| # | ව්‍යාපෘතියේ / උප සංරචකයේ / උප ක්‍රියාකාරකමේ නම | ආරම්භ කළ දිනය | සම්පූර්ණ කළ දිනය | TEC (රු.මි.) | ප්‍රතිපාදනය - 2023 (රු.මි.) | 2023.12.31 දක්වා සමුච්චිත භෞතික සහ | T/P | 1 වන කාර්තුව: ජනවාරි | පෙබරවාරි | මාර්තු | 2 වන කාර්තුව: අප්‍රේල් | මැයි | ජූනි | 3 වන කාර්තුව: ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | 4 වන කාර්තුව: ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | FP: ප්‍රතිදානය | මූල්‍ය ප්‍රගතිය: ප්‍රතිඵලය | ප්‍රතිදාන/ප්‍රතිඵල දර්ශක (KPIs) | වගකිව යුතු නිලධාරියා (නම/ තනතුර/ දුරකථන අංකය) | සටහන් | ආදායම/වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **කර්මාන්ත සේවා අංශය** | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 1 | ගොඩනැගිලි ද්‍රව්‍ය මිල උච්චාවචනය පිළිබඳ මාසික සඟරාවක් ප්‍රකාශයට පත් කිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශවකරුවන් ප්‍රමිතිගත කිරීම | 01.01.2023 | 31.12.2023 | 1.5 | 1.5 | | PT | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | ප්‍රකාශන සංඛ්‍යාව (සඟරා) | | ප්‍රකාශන සංඛ්‍යාව (සඟරා) | AD (DR) - පුරප්පාඩු වී ඇත DD (Adv) - චන්දිමා මිය - 071 8443694 | මිල ඉහළ යාම සහ ඉදිකිරීම් කර්මාන්තයේ පහළයෑමේ නැඹුරුව. | ආදායම |
| | | | | | | | PP | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | | | | | | |
| | | | | | | | FT | 0.13 | 0.25 | 0.38 | 0.5 | 0.63 | 0.75 | 0.88 | 1 | 1.13 | 1.25 | 1.38 | 1.5 | | | | | | |
| | | | | | | | FP | 0.00 | 0.01 | 0.017 | 0.023 | 0.027 | 0.035 | 0.042 | 0.047 | 0.05 | 0.06 | 0.067 | 0.072 | | | | | | |
| 2 | ඉදිකිරීම් කර්මාන්තයට ආරවුල් විසඳුම් සේවා සැපයීම (මැදිහත්වීම, විනිශ්චය කිරීම ආදිය) | 01.01.2023 | 31.12.2023 | 5 (2023 මැයි මාසයේදී මිලියන 2 දක්වා | 5 | | PT | 2 | 4 | 5 | 6 | 7 | 9 | 11 | 13 | 15 | 16 | 18 | 22 | පත් කරන ලද විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව සහ සිදු කරන ලද මැදිහත්වීම් | | පත් කරන ලද විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව සහ සිදු කරන ලද මැදිහත්වීම් | AD(DR)පුරප්පාඩු වී ඇත DD(Advisory) චන්දිමා මිය 071 8443694 | සේවාදායක පාර්ශ්වයෙන් තහවුරු කිරීමක් නොලැබීම නිසා මැදිහත්වීම් සිදු | ආදායම |
| | | | | | | | PP | 4 | 4 | 4 | 7 | 12 | 16 | 17 | 18 | 20 | 22 | 27 | 27 | | | | | | |
| | | | | | | | FT | 0.40 | 1.00 | 1.50 | 1.80 | 1.83 | 1.85 | 1.88 | 1.90 | 1.93 | 1.95 | 1.98 | 2.00 | | | | | | |
| | | | | | | | FP | 0.19 | 0.19 | 0.19 | 0.27 | 0.54 | 0.82 | 0.92 | 1.22 | 1.37 | 1.43 | 1.53 | 1.53 | | | | | | |
| 3 | ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන සේවා සැපයීම | 01.01.2023 | 31.12.2023 | | | | PT | 50 | 120 | 190 | 250 | 310 | 370 | 420 | 500 | 560 | 620 | 700 | 800 | ලබා දෙන ලද උපදෙස් සංඛ්‍යාව | | ලබා දෙන ලද උපදෙස් සංඛ්‍යාව | DD(Advisory) චන්දිමා මිය 071 8443694 | | ආදායම |
| | | | | | | | PP | 50 | 140 | 220 | 280 | 380 | 455 | 545 | 578 | 629 | 671 | 698 | 724 | | | | | | |
| | | | | | | | FT | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | |
| | | | | | | | FP | 0 | 0 | 0 | 0 | 0.36 | 0.36 | 0.36 | 0.36 | 0.36 | 0.36 | 0.36 | 0.36 | | | | | | |
| 4 | වෘත්තිකයන්ගේ ධාරිතාව ගොඩනැගීම සඳහා විනිශ්චය කිරීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම. | 01.01.2023 | 31.12.2023 | 1.8 | 1.8 | | PT | 10 | 12 | 15 | 20 | 20 | 20 | 20 | 20 | 20 | 20 | 20 | 20 | සහභාගිවන් සංඛ්‍යාව | | සහභාගිවන් සංඛ්‍යාව | AD(DR) පුරප්පාඩු වී ඇත හිමාල් මහතා AD(SBD) 071 4870861 | | ආදායම |
| | | | | | | | PP | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | |
| | | | | | | | FT | 0 | 0.24 | 0.48 | 0.90 | 0.90 | 1.14 | 1.14 | 1.38 | 1.62 | 1.80 | 1.80 | 1.80 | | | | | | |
| | | | | | | | FP | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | |
| 5 | තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම සහ විනිශ්චයකරුවන්ගේ සංචිතයක් ලියාපදිංචි කිරීම | 01.01.2023 | 31.12.2023 | 1.14 | 1.14 | | PT | 7 | 21 | 36 | 53 | 58 | 58 | 58 | 58 | 58 | 58 | 58 | 58 | QMAs සහ විනිශ්චයකරුවන් සංඛ්‍යාව | | QMAs සහ විනිශ්චයකරුවන් සංඛ්‍යාව | AD (TA) - පුරප්පාඩු වී ඇත DD (Adv) - චන්දිමා මිය 071 8443694 | ඉදිකිරීම් කර්මාන්තයේ පහළ නැඹුරුව | ආදායම |
| | | | | | | | PP | 0 | 15 | 28 | 30 | 35 | 36 | 37 | 37 | 37 | 37 | 39 | 39 | | | | | | |
| | | | | | | | FT | 0.14 | 0.43 | 0.73 | 1.12 | 1.12 | 1.14 | 1.14 | 1.14 | 1.14 | 1.14 | 1.14 | 1.14 | | | | | | |
| | | | | | | | FP | 0.01 | 0.24 | 0.506 | 0.546 | 0.63 | 0.696 | 0.726 | 0.726 | 0.726 | 0.726 | 0.806 | 0.806 | | | | | | |
| 6 | තත්ත්ව කළමනාකරණ විගණකවරුන් විසින් තාක්ෂණික විගණන ක්‍රියාවලිය සිදු කිරීම | 01.01.2023 | 31.12.2023 | 2 | 2 | | PT | 1 | 2 | 2 | 2 | 4 | 4 | 6 | 6 | 7 | 8 | 9 | 10 | තාක්ෂණ විගණන සංඛ්‍යාව | | තාක්ෂණ විගණන සංඛ්‍යාව | AD (TA) - පුරප්පාඩු වී ඇත DD (Adv) - චන්දිමා මිය 071 8443694 | හිමිකරු තාක්ෂණික විගණනය ඉල්ලා සිටිය යුතු බවයි පවතින ගැසට් | ආදායම |
| | | | | | | | PP | 0 | 0 | 0 | 0 | 1 | 1 | 2 | 2 | 2 | 2 | 2 | 2 | | | | | | |
| | | | | | | | FT | 0 | 0.05 | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.3 | 0.3 | 0.3 | 0.3 | 0.3 | 0.4 | | | | | | |
| | | | | | | | FP | 0 | 0 | 0 | 0 | 0.005 | 0.005 | 0.01 | 0.01 | 0.01 | 0.01 | 0.01 | 0.01 | | | | | | |
| 4. | ප්‍රසාද දීමනා ගෙවීම් | - | - | - | **-** | | | | | **-** |
| 5. | පොත් සහ වාර ප්‍රකාශන | - | - | - | **-** | | | | | **-** |
| 6. | පුහුණුවන්නන් සඳහා මුදල් දීමනා | - | 7,250,000 | 6,000,000 | **13,250,000** | | 17,330,000 | 6,200,000 | 20,000 | **23,550,000** |
| 7. | ජීවන වියදම් දීමනාව | - | 740,436 | - | **740,436** | | 790,920 | | | **790,920** |
| 8. | දෛනික වියදම් සහ නවාතැන් | - | - | - | **-** | | | | | **-** |
| 9. | සංවර්ධන පිරිවැය | - | - | - | **-** | | | | | **-** |
| 10. | E.P.F | - | 793,981 | - | **793,981** | | 848,120 | | | **848,120** |
| 11. | E.T.F | - | 158,796 | - | **158,796** | | 169,624 | | | **169,624** |
| 12. | ප්‍රදර්ශන | - | - | - | **-** | | | | | **-** |
| 13. | සහාය කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු සහ දීමනා | - | 78,200 | 16,600 | **94,800** | | 103,500 | 351,035 | | **454,535** |
| 14. | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු සහ දීමනා | - | 948,378 | 104,870 | **1,053,248** | 41,500 | 2,735,542 | 1,713,284 | 33,850 | **4,524,176** |
| 15. | උපදේශකයන් සඳහා ගාස්තු සහ දීමනා | - | - | - | **-** | | | | | **-** |
| 16. | මගී වාහන සඳහා ඉන්ධන, තෙල් සහ ධාවන වියදම් | - | 389,718 | 29,556 | **419,274** | 70,573 | | 36,304 | | **106,877** |

| | | 2023 | | | | 2022 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අංකය | විස්තරය | බහු නිපුණතා ඉදිකිරීම් පුහුණු වැඩසටහන | මිලියන 200 වැඩසටහන | මිලියන 154 වැඩසටහන | එකතුව | බහු නිපුණතා ඉදිකිරීම් පුහුණු වැඩසටහන | මිලියන 200 වැඩසටහන | මිලියන 154 වැඩසටහන | මිලියන 300 වැඩසටහ න | එකතුව |
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 17. | වෙනත් වාහන සඳහා ඉන්ධන, තෙල් සහ ධාවන වියදම් | - | - | - | - | | | | | - |
| 18. | ඉහළ මට්ටමේ කළමනාකරණ නිලධාරින් සඳහා ඉන්ධන දීමනා | - | 461,495 | - | **461,495** | | 411,815 | | | **411,815** |
| 19. | ශාලා ගාස්තු | - | - | - | - | | 12,000 | | | **12,000** |
| 20. | උපකරණ කුලියට ගැනීම | - | - | - | - | | | | | - |
| 21. | සෞඛ්‍ය හා සනීපාරක්ෂණ | - | 7,230 | - | **7,230** | | 52,134 | 40,610 | | **92,744** |
| 22. | නවාතැන් | - | 158,300 | 23,750 | **182,050** | | 39,750 | 47,250 | | **87,000** |
| 23. | විවිධ | - | 670 | - | **670** | 32,633 | 2,500 | 3,020 | | **38,153** |
| 24. | මාසික දීමනා | - | 474,638 | - | **474,638** | | 507,000 | | | **507,000** |
| 25. | කාර්යාල අවශ්‍යතා | - | - | - | - | | | | | - |
| 26. | වෙනත් දීමනා | - | - | - | - | 20,160 | 281,966 | | | **302,126** |
| 27. | වෙනත්-පුහුණු | - | 216,000 | - | **216,000** | | | | | - |
| 28. | අතිකාල සහ නිවාඩු දින ගෙවීම් (I) | - | - | - | - | | 2,027 | | | **2,027** |
| 29. | අතිකාල/නිවාඩු ගෙවීම් | - | 933,016 | 374,755 | **1,307,771** | 1,133,282 | 1,633,616 | 795,442 | | **3,562,340** |
| 30. | ඡායා පිටපත් වියදම් | - | 36,570 | 6,740 | **43,310** | | 25,983 | 36,526 | | **62,509** |
| 31. | තැපැල් ගාස්තු | - | 6,440 | 1,830 | **8,270** | 990 | 36,136 | 7,140 | | **44,266** |
| 32. | මුද්‍රණය, ටයිප් කිරීම සහ පරිවර්තනය | - | - | - | - | 13,040 | 44,075 | 4,000 | | **61,115** |
| 33. | පුහුණු වැඩසටහන් සඳහා කෙටි ආහාරපාන | - | 578,125 | 64,025 | **642,150** | 1,744,283 | 765,575 | 454,295 | | **2,964,153** |
| 34. | කෙටි ආහාරපාන | - | - | - | - | 29,065 | 24,865 | 43,000 | 4,135 | **101,065** |

| අංකය | විස්තරය | 2023 | | | | 2022 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | බහු නිපුණතා ඉදිකිරීම් පුහුණු වැඩසටහන | මිලියන 200 වැඩසටහන | මිලියන 154 වැඩසටහන | එකතුව | බහු නිපුණතා ඉදිකිරීම් පුහුණු වැඩසටහන | මිලියන 200 වැඩසටහන | මිලියන 154 වැඩසටහන | මිලියන 300 වැඩසටහන | එකතුව |
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 35. | වාරික සහ කුලී ගාස්තු | - | 180,700 | 37,200 | **217,900** | 6,000 | 378,483 | 408,770 | - | **793,253** |
| 36. | ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | 130,000 | - | - | **130,000** | | | | | - |
| 37. | මගී වාහන අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | - | - | - | - | | | | | - |
| 38. | වෙනත් වාහන අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | - | - | - | - | | | | | - |
| 39. | වැටුප් සහ වේතන | - | 4,591,894 | - | **4,591,894** | | 4,863,213 | | | **4,863,213** |
| 40. | වැටුප් සහ වේතන සහ දීමනා - තාවකාලික කාර්ය මණ්ඩලය | - | - | - | - | 1,070,740 | 474,000 | 237,000 | | **1,781,740** |
| 41. | ශිල්ප සවිය මෙවලම් කට්ටලය | - | - | - | - | | 1,959,207 | 1,009,974 | | **2,969,181** |
| 42. | ලිපිද්‍රව්‍ය | - | 20,190 | 3,350 | **23,540** | | 21,824 | 25,135 | | **46,959** |
| 43. | දුරකථන | - | 104,016 | 25,961 | **129,977** | | 63,610 | 68,635 | | **132,245** |
| 44. | දුරකථන දීමනා | - | 49,800 | - | **49,800** | | 37,350 | | | **37,350** |
| 45. | පුහුණු ආධාර | - | - | - | - | | - | | | - |
| 46. | පුහුණු ද්‍රව්‍ය | - | - | - | - | | 6,345 | | 3,664 | **10,009** |
| 47. | ගමන් (දේශීය) | - | 186,952 | 59,716 | **246,668** | 42,100 | 257,029 | 221,339 | | **520,468** |
| 48. | ගමන් (ආදායම් උත්පාදනය) | - | - | - | - | | 588,324 | | | **588,324** |
| 49. | පුහුණුකරුවන්ට නිල ඇඳුම් | - | - | - | - | | - | | | - |
| 50. | පුහුණුව සඳහා ඉන්ධන | - | - | - | - | 708 | | | | **708** |
| 51. | වෙනත් පුහුණුව | - | - | - | - | 10,965 | | | | **10,965** |
| 52. | ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | - | - | - | - | 96,807 | | | | **96,807** |

| අංකය | විස්තරය | 2023 | | | | 2022 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **බහු නිපුණතා ඉදිකිරීම් පුහුණු** වැඩසටහන | **මිලියන 200** වැඩසටහන | **මිලියන 154** වැඩසටහන | එකතුව | **බහු නිපුණතා ඉදිකිරීම් පුහුණු** වැඩසටහන | **මිලියන 200** වැඩසටහන | **මිලියන 154** වැඩසටහන | **මිලියන 300** වැඩසටහන | එකතුව |
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 53. | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | - | - | - | - | 30,000 | | | | **30,000** |
| 54. | අන් අය | - | - | - | - | 66,800 | | | | **66,800** |
| 55. | අනෙකුත් වාහන සඳහා ඉන්ධන, තෙල් ධාවන වියදම් | - | - | - | - | 2,889,289 | | | | **2,889,289** |
| 56. | උපකරණ කුලියට ගැනීම | - | - | - | - | 30,000 | | | | **30,000** |
| | **එකතුව** | **130,000** | **18,365,545** | **6,748,353** | **25,243,898** | **8,593,721** | **34,982,812** | **12,389,500** | **61,649** | **56,027,682** |

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආදර්ශ වැඩසටහන සහ සයනි ව්‍යාපෘතිය සමඟ ඉදිකිරීම් කර්මාන්තය සඳහා නිපුණතා පුහුණුව සඳහා අයවැය ප්‍රතිපාදන සහ උපයෝජනය

**ප්‍රාග්ධන අයවැය වෙන්කිරීම (2021):**

එකතුව: රු. 200,000,000

**2023 වර්ෂයේ උපයෝජනය:** -

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආදර්ශ වැඩසටහන යටතේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා නිපුණතා පුහුණුව:2021

උපයෝජිත මුදල: රු. 18,365,545

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආදර්ශ වැඩසටහන යටතේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා නිපුණතා පුහුණුව: (2020, 2019,):

උපයෝජිත මුදල: රු. 6,748,353

**සයනි ව්‍යාපෘතිය (2023):**

ප්‍රාග්ධන අත් පත් කර ගැනීම් සඳහා උපයෝජනය කරන ලද මුදල: ශ්‍රීලරු 8,867,200 සහ පුනරාවර්තන වියදම : ශ්‍රීලරු 130,000
හුවමාරු නොවන ගනුදෙනු යටතේ වර්ගීකරණය කර ඇත.

**සටහන - 24**

**භාණ්ඩාගාර ප්‍රදාන -පුනරුත්ථාපනය කරන ලද පුද්ගලයන් 500ක් බැකෝ ලෝඩර් ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම**

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | ජීවන වියදම් දීමනාව | 161,700 | - |
| 2. | E.P.F | 33,864 | - |
| 3. | E.T.F | 6,666 | - |
| 4. | පුහුණුව සඳහා ඉන්ධන | 368,460 | - |
| 5. | අන්තර්ජාල ගාස්තු | 7,545 | - |
| 6. | විවිධ වියදම් | 7,965 | - |
| 7. | අතිකාල/නිවාඩු දින ගෙවීම් | 586,289 | - |
| 8. | ඡායාපිටපත් වියදම් | 10,000 | - |
| 9. | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | 77,081 | - |
| 10. | වැටුප් හා දීමනා | 971,678 | - |
| 11. | ආරක්ෂක සේවාවන් | 95,455 | |
| 12. | ලිපිද්‍රව්‍ය | 133,825 | |
| 13. | දුරකථන | 5,000 | |
| 14. | ගමන් (දේශීය) | 256,061 | |
| 15. | වෙනත් වාහන අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | 278,411 | |
| | **මුළු වියදම** | **3,000,000** | **-** |

අයවැය ප්‍රතිපාදන අනුව 2023 දී CIDA හි බැකෝ ලෝඩර් පුහුණුකරුවන් 500 දෙනෙකුගේ පුහුණුව සඳහා මුදල් අමාත්‍යාංශය විසින් රු. 3,000,000.00 ප්‍රාග්ධන ප්‍රදානයක් ලබා දෙන ලදී. CIDA යටතේ පිහිටුවන ලද බැකෝ ලෝඩර් පුහුණු මධ්‍යස්ථානය - OTC ගල්කුලම හි අභ්‍යාසලාභීන් 500 ක් පුහුණු කිරීම සඳහා මෙම ප්‍රාග්ධන ප්‍රදානය භාවිතා කර ඇත.

සටහන 25 -පුද්ගල පඩිනඩි

| අංකය | විස්තරය | 2023 | 2022 |
| --- | --- | --- | --- |
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | වැටුප් හා වේතන | 93,779,364 | 107,620,682 |
| 2. | ජීවන වියදම් දීමනාව | 18,620,975 | 21,283,986 |
| 3. | ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම | 6,925,282 | 6,879,314 |
| 4. | මාසික දීමනා | 11,991,989 | 13,546,146 |
| 5. | දූවිලි දීමනාව | 578,986 | 149,300 |
| 6. | වැඩ බැලීමේ දීමනාව | 2,009,868 | 791,476 |
| 7. | වෙනත් දීමනා | 3,578,020 | 4,157,224 |
| 8. | ඉහළ මට්ටමේ කළමනාකරණ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා | 3,339,524 | 3,227,366 |
| 9. | ඉහළ මට්ටමේ කළමනාකරණ නිලධාරීන් සඳහා වාහන දීමනාව | 43,548 | 750,000 |
| 10. | අතිකාල/නිවාඩු දින ගෙවීම | 14,361,069 | 15,033,016 |
| 11. | අතිකාල සහ නිවාඩු දින ගෙවීම (I) | 3,655,344 | 2,929,365 |
| 12. | වෘත්තීය සංවිධාන සඳහා සාමාජිකත්ව දායකත්වය | 63,876 | 50,926 |
| 13. | ප්‍රසාද දීමනා ගෙවීම් | 6,048,836 | 5,770,144 |
| 14. | E. P. F | 16,905,133 | 19,243,464 |
| 15. | E. T.F | 3,381,134 | 3,850,406 |
| 16. | දුරකථන දීමනාව | 562,839 | 713,695 |
| 17. | වැටුප්, වේතන සහ දීමනා - ස්ථිර නොවන කාර්ය මණ්ඩලය | - | 701,515 |
| 18. | පාරිතෝෂික | 6,290,030 | 6,522,741 |
| | එකතුව | **192,135,818** | **213,220,764** |

සටහන 26 - ගමන් වියදම්

| අංකය | විස්තරය | 2023 | 2022 |
| --- | --- | --- | --- |
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | ගමන් වියදම් - (දේශීය) | 954,670 | 871,272 |
| 2. | ගමන් වියදම් - (ආදායම් උත්පාදනය වන) | 127,950 | 22,000 |
| 3. | ගමන් වියදම් - (විදේශීය) | 29,552 | |
| | එකතුව | **1,112,172** | **893,272** |

**සටහන 27 - සැපයුම් සහ අවශ්‍යතා**

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | ඡායා පිටපත් වියදම් | 7,064,092 | 6,247,749 |
| 2. | ලිපිද්‍රව්‍ය | 2,088,091 | 950,188 |
| 3. | කාර්යාල අවශ්‍යතා | 86,934 | 157,344 |
| 4. | මුද්‍රණ, යතුරු ලියන හා පරිවර්තන | 431,515 | 337,104 |
| 5. | පොත් හා වාර සඟරා | 509,430 | 493,704 |
| 6. | ශ්‍රව්‍ය දෘශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 152,398 | 160,552 |
| | එකතුව | **10,332,461** | **8,346,641** |

**සටහන 28 - නඩත්තු වියදම්**

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 2,584,455 | 580,730 |
| 2. | ලී බඩු හා කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 4,346,772 | 3,720,280 |
| 3. | මගී වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 7,288,045 | 4,033,805 |
| 4. | වෙනත් වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 2,456,210 | 209,556 |
| 5. | පිරියත, යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 1,811,908 | 165,780 |
| 6. | මෙවලම් හා උපකරණ ද්‍රව්‍ය අලුත්වැඩියාව | 18,192 | 900 |
| 7. | වෙනත්/තොරතුරු තාක්ෂණ, යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 453,190 | 114,700 |
| 8. | රක්ෂණ (වාහන) | 973,283 | 1,867,770 |
| | එකතුව | **19,932,055** | **10,693,521** |

**සටහන 29 - ඉන්ධන හා උපයෝගීතා ගෙවීම්**

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | මගී වාහනවල ඉන්ධන හා ධාවන වියදම් | 11,931,286 | 9,470,282 |
| 2. | වෙනත් වාහනවල ඉන්ධන හා ධාවන වියදම් | 1,416,499 | 1,807,192 |
| 3. | කුලී හා කුලී ගාස්තු | 346,857 | 248,196 |
| 4. | තැපැල් ගාස්තු | 757,755 | 635,030 |
| 5. | දුරකථන ගාස්තු | 1,198,389 | 1,764,831 |
| 6. | අන්තර්ජාල ගාස්තු | 967,077 | 849,469 |
| 7. | විදුලි ගාස්තු | 18,668,470 | 10,326,968 |
| 8. | ජල ගාස්තු | 1,810,913 | 1,101,135 |
| 9. | සෞඛ්‍ය හා සනීපාරක්ෂණ | 10,674,202 | ,638,007 |
| 10. | ආරක්ෂක සේවා | 9,876,898 | 1,110,612 |
| | එකතුව | **57,648,346** | **5,951,721** |

**සටහන 30-පර්යේෂණ, සංවර්ධන හා පුහුණු වියදම්**

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | ශිෂ්‍යත්ව හා පුහුණු - (දේශීය) | 764,180 | 205,620 |
| 2. | ශිෂ්‍යත්ව හා පුහුණු - (විදේශීය) | 130,000 | - |
| 3. | උපදේශකවරුන්ට ගාස්තු හා දීමනා | 460,800 | 282,500 |
| 4. | අධ්‍යයන කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා | 9,002,810 | 8,030,500 |
| 5. | සහාය කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා | 16,000 | - |
| 6. | පුහුණු ද්‍රව්‍ය | 451,816 | 33,033 |
| 7. | පුහුණු සඳහා ඉන්ධන | 2,722,328 | 1,500 |
| 8. | අත් මෙවලම් හා කුඩා උපකරණ | 26,923 | 12,267 |
| 9. | පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම් | 7,158 | 17,917 |
| 10. | පුහුණු වැඩසටහන් සඳහා ආහාර පාන | 17,477,001 | 2,113,811 |
| 11. | වෙනත් - පුහුණු | 35,057 | 11,900 |
| 12. | පුහුණුවීම් සඳහා මුදල් දීමනා | - | - |
| 13. | පුහුණුවන්නන් සඳහා දීමනා | 637,500 | 735,250 |
| 14. | උපකරණ කුලියට ගැනීම | 42,400 | 112,500 |
| 15. | ශාලා ගාස්තු | 152,640 | - |
| 16. | වාර්ෂික අලුත් කිරීමේ ගාස්තු -Accsoft පැකේජය | 81,603 | 136,743 |
| 17. | සංවර්ධන පිරිවැය | 57,500 | 23,870 |
| 18. | ස්ථාන සංචාර වියදම් | - | 168,000 |
| 19. | N.V.Q.වියදම් | 22,900 | 2,800 |
| | **එකතුව** | **32,088,615** | **11,888,211** |

**සටහන 31- මූල්‍ය පිරිවැය**

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | බැංකු ගාස්තු | 132,732 | 189,489 |
| 2. | කල් බදු පොලී - මූල්‍ය කල්බදු | 543,720 | 1,468,068 |
| | **එකතුව** | **676,451** | **1,657,557** |

**සටහන 32 - ක්‍රමක්ෂය**

**සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණ**

2023 වර්ෂය සඳහා මුළු ක්ෂය වියදම රු. 61,361,333.00කි. වාර්තාකරණ දිනයට තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ:

| | වත්කම් වර්ගය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| * | පුස්තකාල පොත්-CETRAC | 910,692 | 911,067 |
| * | පුස්තකාල පොත් - ප්‍රධාන කාර්යාලය | 1,326,863 | 1,326,863 |
| * | මෙවලම් හා උපකරණ | 19,528,053 | 19,557,852 |
| * | ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ | 77,325,867 | 74,067,851 |
| * | ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ | 6,038,206 | 5,966,294 |
| | **එකතුව** | **105,129,681** | **101,829,927** |

සටහන 33 - වෙනත් වියදම්

| අංකය | විස්තරය | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලරු | ශ්‍රීලරු |
| 1. | සේවකයන් සඳහා නිල ඇඳුම් | 2,474,812 | 1,202,447 |
| 2. | සේවකයන් සඳහා තේ | 4,439,028 | 2,371,695 |
| 3. | සෞඛ්‍ය රක්ෂණය | 2,683,845 | 2,947,000 |
| 4. | වෙනත් | 43,250 | 64,600 |
| 5. | සුබසාධන | 170,638 | 34,310 |
| 6. | ප්‍රදර්ශන | 294,874 | - |
| 7. | වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණය | 1,778,624 | 858,225 |
| 8. | කෙටි ආහාරපාන | 815,693 | 620,646 |
| 9. | රැස්වීම් දීමනා | 1,685,000 | 1,888,954 |
| 10. | විගණන ගාස්තුව | 1,819,323 | 117,600 |
| 11. | නීති ගාස්තු | 7,786,380 | 3,389,164 |
| 12. | බලපත්‍ර ගාස්තුව | 549,768 | 406,918 |
| 13. | විවිධ වියදම් | 60,735 | 74,767 |
| 14. | කුලී සහ ගාස්තු | 322,589 | 159,266 |
| 15. | ලීසිං ක්‍රමක්ෂය කිරීම | 32,613 | 32,614 |
| 16. | නවාතැන් | 72,500 | 97,560 |
| 17. | මෙහෙයුම් කල්බදු -සව්සිරිපාය ඉඩම සහ පරිශ්‍රය | 200,000 | 200,000 |
| 18. | තාක්ෂණික විගණකවරුන් සඳහා ගාස්තු සහ දීමනා | - | 334,900 |
| 19. | ISO වාර්ෂික ගාස්තුව | 698,612 | 425,302 |
| 20. | සමාජ ආරක්ෂණ දායක බද්ද | 6,657,134 | 1,205,044 |
| 21. | ඉදිකිරීම් විනිශ්චය පිළිබඳ ඩිප්ලෝමාව අලුත් කිරීමේ ගාස්තුව-TVEC | - | 7,500 |
| 22. | බොල් ණය ඌන ප්‍රතිපාදන | 29,049 | 238,878 |
| 23. | අධිභාර | 20,183 | 56,232 |
| 24. | බොල් ණය | 252,985 | - |
| 25. | ඉදිකිරීම් විශිෂ්ටතා වියදම් | - | - |
| 26. | අලාභ සහ කපා හැරීම් | 193,188 | - |
| 27. | රඳවා ගැනීමේ බදු වියදම් | 363,630 | - |
| | **එකතුව** | **33,444,450** | **16,733,619** |

සටහන 34

භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන (පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව සහ ප්‍රාග්ධන සඳහා භාණ්ඩාගාර අග්‍රිමය - (රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ආදර්ශය වැඩසටහන් සමඟ ඉදිකිරීම් කර්මාන්තය සඳහා නිපුණතා පුහුණුව, ලියාපදිංචි පුහුණු ඉදිකිරීම් ශිල්පීන් සඳහා ශිල්පී හැඳුනුම්පත නිකුත් කිරීම, ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු (OTC) තාක්ෂණික පුහුණුවේ යටිතල පහසුකම් සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම) සහ භාණ්ඩාගාර අග්‍රිම-ප්‍රාග්ධන-බැකෝ ලෝඩර් පුහුණු වැඩසටහන (OTC) සඳහා ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ මුදල් අමාත්‍යාංශය විසින් අරමුදල් සපයනු ලැබේ. තවද අදාළ වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ආදායම සමාන ප්‍රමාණයකට තාර්කික පදනමක් මත අදාළ වර්ෂයේ හඳුනාගනු ලබන අතර එම ආදායම හා වියදම CIDA ගිණුම්කරණ ප්‍රතිපත්ති (ප්‍රාග්ධන ප්‍රදාන) වලට අනුකූලව අදාල වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනම දක්වනු ලැබේ.

**සටහන 35 -මුදල් සහ බැංකු**

මුදල් සහ බැංකු ශේෂයන් අතැති මුදල්, සුළු මුදල්, බැංකු ජංගම ගිණුම් සහ කෙටි කාලීන (මාස 03ට අඩු) ආයෝජනවලින් සමන්විත වේ. ශ්‍රීලරු.මි.225.1 ක බැංකු ශේෂයෙන් ශ්‍රී ලංකා රු.මි.37.1 ක මුදලක් භාණ්ඩාගාරය විසින් අරමුදල් සපයන ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගත යුතුය.

**සටහන 36 - තොග**

තොග පිරිවැය පදනම මත දක්වා ඇත. තොග වලට අමතර කොටස්, නඩත්තු අයිතම, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය හා වෙනත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ආදිය ඇතුලත් වේ. සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය මත ද්‍රව්‍ය නිකුත් කරන අතර අවසන් තොගය ද සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කරනු ලැබේ.

**සටහන 37- වාර්තාකරණ දිනයට පසු සිදුවීම්**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2022/2023 වසරේදී තම දේපළ, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. උපකරණ සහ උපකරණ, CIDA ප්‍රධාන කාර්යාලයේ පුස්තකාල පොත් සහ CETRAC හි පුස්තකාල පොත් අදාළ පාර්ශ්වයන් විසින් දැනටමත් සම්පූර්ණ කර ඇත. අනෙකුත් දේපළ, පිරියත සහ උපකරණ 2023.12.31 දින වනවිට සිදු කරමින් පවතී. CIDA විසින් දැනටමත් ප්‍රත්‍යාගණනය කළ අගයන් අදාළ ගිණුම්වලට ගැලපීමට තීරණය කර ඇත. 2024 පළමු කාර්තුව සඳහා වන විගණන හා කළමනාකරණ කමිටුව (2024.02.08 දින පැවති) දේපළ, පිරියත සහ උපකරණවල ඓතිහාසික පිරිවැය තවදුරටත් පවත්වාගෙන යාමට උපදෙස් දී ඇත.

**සටහන 38 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්**

**a.** නෛතික නඩු කටයුතු, ඒවායේ ස්වභාවය සහ තත්ත්වය සමඟ හෙළිදරව් කර ඇත. 2023 දෙසැම්බර් 31 වන දිනට සඳහන් කළ යුතු පහත සඳහන් නීතිමය නඩු ඇත. වාර්තාකරණ දිනය වන විට අදාළ අධිකරණ විසින් අවසාන තීන්දුව ලබා දී නොමැත.

| අංකය. | නඩු අංකය. | ගොනු කරන ලද පාර්ශ්වය | අධිකරණය | නඩුවේ විෂයය |
|---|---|---|---|---|
| 1. | CA Writ අංකය.452/2020 | උපදේශක සමාගම් 4 | අභියාචනාධිකරණය | සුදුසුකම් ලත් පුද්ගල සමාගම් ලියාපදිංචිය |
| 2. | CA Writ අංකය.574/2021 | ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය (SLIA) | අභියාචනාධිකරණය | UDA හි සැලසුම් සහ සංවර්ධන නියාමනය |
| 3 | COC අංකය. 10/2022 | ටී.වී.සෙම්බුකුට්ටිආරච්චි හිටපු අධ්‍යක්ෂ (මුදල්) | අභියාචනාධිකරණය | අධිකරණයට අපහාස කිරීම |
| 4 | CC/C/IR/09/282/2021 | අධ්‍යක්ෂ (EMS) | කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ | සේවා කොන්දේසි සහ රැකියා විස්තරය |
| 5 | CC/C//G/09/246/2022 | හිටපු සේවක ඩී.ජී.පී. දමයන්ති මිය | කම්කරු දෙපාර්තමේන්තුව– කොළඹ | ජීවන වියදම් දීමනාව (COLA) සංරචකයට අදාළ පාරිතෝෂිත ගෙවීමේ හිඟ මුදල් සඳහා හිමිකම් පෑම |
| 6 | ANR/COM/03/G/202208/00070 | හිටපු සේවක ඉංජි. ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | කම්කරු දෙපාර්තමේන්තුව- අනුරාධපුර | පාරිතෝෂිත දීමනා ගෙවීමේ ප්‍රමාදය |
| 7 | GMP/COM/04/G/202208/00110 | හිටපු සේවක ජී. ඉන්ද්‍රානී මිය | කම්කරු දෙපාර්තමේන්තුව– ගම්පහ | පාරිතෝෂිත දීමනා ගෙවීමේ ප්‍රමාදය |
| 8. | CC/C/IR/10/539/2022 | ඒ ආර් එම් පී රත්නායක මහතා අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන) | කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ | අනිවාර්ය නිවාඩු යැවීම |
| 9. | CC/C/IR/9/771/2023 | එච් එන් හික්කඩුව මහතා (SBD ලියාපදිංචිය) | කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ | තනතුර ස්ථිර කිරීම සම්බන්ධයෙන් |

| අංකය. | නඩු අංකය. | ගොනු කරන ලද පාර්ශ්වය | අධිකරණය | නඩුවේ විෂයය |
|---|---|---|---|---|
| 10. | CC/C/IR/9/770/2023 | ඩබ්ලිව් එන් ටී ගුණරත්න මහතා සහකාර අධ්‍යක්ෂ (IT) | කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ | තනතුර ස්ථිර කිරීම සම්බන්ධයෙන් |
| 11. | A/69/2023 | එච් පී එම් එස් එච් කේ පොඩිනිලමේ මහතා | කම්කරු මහලේකම් කාර්යාලය/ කර්මාන්ත උසාවිය | ලබා නොදුන් උසස් වීමක් සම්බන්ධ වැටුප් වර්ධක |
| 12. | LT 08/471/2021 | එච් කේ බාලචන්ද්‍ර මහතා හිටපු අධ්‍යක්ෂ ජනරාල් | කම්කරු විනිශ්චය සභාව | සේවය අවසන් කිරීම |
| 13. | LT/01/36/2023 | ආර් රාමලිංගම් මහතා හිටපු අධ්‍යක්ෂ ජනරාල් | කම්කරු විනිශ්චය සභාව කම්කරු විනිශ්චය සභාව | සේවය අවසන් කිරීම සේවය අවසන් කිරීම |
| 14. | LT/01/42/2022 | ටී වී සෙම්බුකුට්ටිආරච්චි මහතා හිටපු අධ්‍යක්ෂ (මුදල්) | කම්කරු විනිශ්චය සභාව | සේවය අවසන් කිරීම |
| 15. | H.R.C. 2545/21 | ටී වී සෙම්බුකුට්ටිආරච්චි මහතා හිටපු අධ්‍යක්ෂ (මුදල්) | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | අනිවාර්යය නිවාඩු යැවීම |
| 16. | H R C /4158/22 | ඒ ආර් එම් පී රත්නායක මහතා අධ්‍යක්ෂක (මානව සම්පත් හා පරිපාලන) | මානව හිමිකම් කොමිෂන් සභාව | අනිවාර්යය නිවාඩු යැවීම |
| 17. | H R C /4121/22 | ඒ ආර් එම් පී රත්නායක මහතා අධ්‍යක්ෂක (මානව සම්පත් හා පරිපාලන) | මානව හිමිකම් කොමිෂන් සභාව | අනිවාර්යය නිවාඩු යැවීම |
| 18. | HC 57/2022<br><br>(අමිල ප්‍රසන්න බණ්ඩාර මහතා- OTC අනුරාධපුර) | ස්ථාන භාර නිලධාරි, පොලිස් ස්ථානය, අනුරාධපුර | මහාධිකරණය - අනුරාධපුර | මූල්‍ය වංචාව |
| 19. | HCALT 29/2022 | එච් කේ බාලචන්ද්‍ර මහතා<br><br>හිටපු අධ්‍යක්ෂ ජනරාල් ට එරෙහිව | මහාධිකරණය | LT/08/471/2021 තීන්දුවට එරෙහිව අභියාචනය කිරීම |
| 20. | SC SPL LA 226/2022 | ටී වී සෙම්බුකුට්ටිආරච්චි මහතා හිටපු අධ්‍යක්ෂ (මුදල්) ට එරෙහිව | ශ්‍රේෂ්ඨාධිකරණය | CA Writ 40/2022 තීන්දුවට එරෙහිව අභියාචනය කිරීම |
| 21. | SC (HC) LA අංකය. 60/2023 | එච් කේ බාලචන්ද්‍ර මහතා<br><br>හිටපු අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රේෂ්ඨාධිකරණය | HCALT 29/2022 තීන්දුවට එරෙහිව අභියාචනය කිරීම |
| 22. | Case අංකය. 5186/M | කොන්ත්‍රාත්තුවක් ලබා ගත් කොන්ත්‍රාත්කරුවෙක් (CIDA සාක්ෂිකරුවෙකු ලෙස) | දිස්ත්‍රික් උසාවිය, කඩුවෙල | කොන්ත්‍රාත්තුව සඳහා සිදු කරන ලද ගෙවීම නිවැරදි නොවේ |
| 23. | Case අංකය. 5187/M | කොන්ත්‍රාත්තුවක් ලබා ගත් කොන්ත්‍රාත්කරුවෙක් (CIDA සාක්ෂිකරුවෙකු ලෙස) | දිස්ත්‍රික් උසාවිය, කඩුවෙල | කොන්ත්‍රාත්තුව සඳහා සිදු කරන ලද ගෙවීම නිවැරදි නොවේ. |

| අංකය. | නඩු අංකය. | ගොනු කරන ලද පාර්ශ්වය | අධිකරණය | නඩුවේ විෂයය |
|---|---|---|---|---|
| 24. | DMR/3067/2022 | තරංග විශ්වජිත් සෙම්බුකුට්ටිආරච්චි මහතා | දිස්ත්‍රික් උසාවිය, කොළඹ | සේවය අවසන් කිරීම හේතුවෙන් සිදු වූ හානි |
| 25. | Case අංකය. 24094/M | පාඨමාලා සහතිකපත්‍ර හිමිකරුවෙකු | දිස්ත්‍රික් උසාවිය, අනුරාධපුර | OTC විසින් දෙන ලද සහතිකය ඔප්පු කිරීම |
| 26. | CC/C/EPF/719/2017 | CIDA සේවකයින්ගෙන් සමන්විත 'ජාතික සේවක සංගමය' | කම්කරු දෙපාර්තමේන්තුව– කොළඹ | 2006.01.01 සිට 2011.06.01 දක්වා කාලය තුළ ICTAD සේවකයින්ට අදාළ EPF හිඟ මුදල්, අධිභාර සමඟ |

b. නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල, පැලවත්තෙහි ඉඩම (1993.11.30 දිනැති අංක 1011 සැලැස්මෙහි කැබලි අංක 1 සහ 1993.11.30 දිනැති අංක 1010 සැලැස්මෙහි කැබලි අංක 1) 99 අවුරුදු කල්බදු ගිවිසුම යටතේ පවතින අතර දෙපාර්ශ්වයම කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුය.

c. හිටපු මුල්‍ය අධ්‍යක්ෂ ටී.වී.සෙම්බුකුට්ටිආරච්චි මහතා ඔහුට සිදු වූ අලාභ හානි සඳහා රු. මිලියන 500ක් ඉල්ලා කොළඹ දිසා අධිකරණය හමුවේ අංක-DMR/3067/2022 යටතේ නඩුවක් ගොනු කර ඇත. අදාළ අධිකරණය මගින් අවසන් තීන්දුව වාර්තා කරන දිනය වන විට ලබා දී නොමැත.

<u>සටහන -39 -කල්බදු</u>

පහත වත්කම් 2019 ජනවාරි මස මුල්‍ය කල්බදු යටතේ මිලදී ගෙන ඇත. ලංකා බැංකුව විසින් මූල්‍ය කල්බදු පහසුකම සපයා ඇත. බදු වාරිකය ගෙවනු ලබන්නේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසිනි. මහා භාණ්ඩාගාරය 2021 සිට මේ දක්වා වාර්ෂික බදු වාරිකය ප්‍රදානය කරයි. අධිකාරියේ ක්ෂයවීම් ප්‍රතිපත්තිය වර්ෂයකට 12.5%.ට අනුව මෝටර් රථ ක්ෂය කරමින් පවතී.

| අංකය | වත්කම් වර්ගය | පිරිවැය (ශ්‍රීලරු) | වාර්තාකරණ දිනයට ක්ෂය සඳහා ප්‍රතිපාදන (ශ්‍රීලරු) | ශුද්ධ ධාරණ වටිනාකම (ශ්‍රීලරු) | කල්බදු කාල පරිච්ඡේදය | බදුකරු |
|---|---|---|---|---|---|---|
| 1. | මිට්ෂුබිසි -මෝටර් රථය | 11,035,490 | 6,897,181 | 4,138,309 | 05Years | ලංකා බැංකුව |
| 2. | මිට්ෂුබිසි - මෝටර් රථය | 11,035,490 | 6,897,181 | 4,138,309 | 05Years | ලංකා බැංකුව |
| 3. | මිට්ෂුබිසි - මෝටර් රථය | 11,035,490 | 6,897,181 | 4,138,309 | 05Years | ලංකා බැංකුව |
| | එකතුව | **33,106,470** | **20,691,544** | **12,414,926** | | |

<u>මෙහෙයුම් කලුබදු</u>

පහත සඳහන් වත්කම් මෙහෙයුම් කල්බදු යටතේ ලබා ගෙන ඇත.

| අංකය | වත්කම් වර්ගය | පිරිවැය (ශ්‍රීලරු) | වාර්තාකරණ දිනයට ක්ෂය සඳහා ප්‍රතිපාදන (ශ්‍රීලරු) | ශුද්ධ ධාරණ වටිනාකම (ශ්‍රීලරු) | කල්බදු කාල පරිච්ඡේදය | බදුකරු |
|---|---|---|---|---|---|---|
| 1. | නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය - පැලවත්ත, බත්තරමුල්ල | 2,851,477 | 568,523 | 2,282,955 | 99 Years | නාගරික සංවර්ධන අධිකාරිය |
| 2. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 123,"සව්සිරිපාය",විජේරාම මාවත, කොළඹ 07. | 6,000,000 | 1,526,575 | 4,473,425 | 30 Years | වෝටර් හෝල් රහහල පදනම |
| | එකතුව | **8,851,477** | **2,095,098** | **6,756,379** | | |

<u>සටහන - 40- සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්</u>

වාර්තාකරණ වර්ෂය සඳහා සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයක් සලකා බලමින් නොමැත.

## 9.0 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. CAE/B/CIDA/02/FA/2023/05 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ජූලි 19 දින |

සභාපති
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 9

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය අනුව තොග ශේෂයේ වටිනාකම රු. මිලියන 164.91 ක් වූ අතර එහි ඇතුලත් පුහුණු උපකරණ, ප්‍රධාන තොග වලින් වෙන්කර හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද තොග ලැබීම් හා නිකුත් කිරීම් කළමනාකරණය සඳහා විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර නොමැති හෙයින් යල්පැන ගිය සෙමින් චලනය වන හා චලනය නොවන තොග හඳුනාගැනීමටද නොහැකි වූ බැවින් මෙම තොග වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) අධිකාරිය විසින් බත්තරමුල්ල ප්‍රදේශයෙහි පවත්වාගෙන යනු ලබන ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් තුල පිහිටුවා තිබුණු අතර, මෙම ඉඩම සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුමකට එළඹීම සඳහා රු. මිලියන 54.89 ක් හා සියයට 07 ක ප්‍රමාද පොළියක් ලබාදෙන ලෙස 2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දින තෙක් අධිකාරිය විධිමත් ගිවිසුමකට එළඹීමට සහ මෙම ගෙවිය යුතු මුදල් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 13 ඡේදයට පටහැනිව අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ඉදිකිරීම් උපකරණ, පුහුණු මධ්‍යස්ථානය සතු රු. මිලියන 12.15 ක් වටිනා පුහුණු උපකරණ, තොග ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2020 වර්ෂයේදී රු. මිලියන 1.21 ක් වැය කර ඉදිකිරීම් ආරම්භ කරන ලද Well Water Plant ප්‍රාග්ධන ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ නමුත් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) වැට් බදු සඳහා ප්‍රකාශිත ආදායම රු. මිලියන 200.85 ක් වන අතර මූල්‍ය ප්‍රකාශන අනුව වැට් බදු සඳහා පදනම් විය යුතු ආදායම රු. මිලියන 207.37 ක් විය. වැට් බදු ගණනය කිරීමේදී ප්‍රකාශිත ආදායම රු. මිලියන 6.52 ක් අඩුවෙන් යොදාගෙන තිබීම නිසා වැට්බදු ගෙවිය යුතු ගිණුම අව ප්‍රමාණය වී ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

පිටුව 2 | 9

**1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පිටුව 3 | 9

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

පිටුව 4 | 9

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ), (ආ), (ඇ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් පරිදි අධිකාරියේ යම් සාමාජිකයෙකුට අධිකාරියට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | මුදල් රෙගුලාසි 71 (i) ඒ | අධිකාරිය විසින් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 6.05 ක දිරිදීමනා ගෙවා තිබුණි. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොත | |
| | 3.5 හා 6.8 වගන්ති | අධිකාරිය සතු වෑන් රථයක් රියදුරු ද සමඟ 2023 ජූලි මාසයේ සිට ද, අධිකාරියේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රියාකරු තනතුරේ අනුයුක්තව සිටි සේවකයකු 2007 මැයි මාසයේ සිට ද, අමාත්‍යාංශයේ කටයුතු සඳහා මුදාහැර තිබුණු අතර, අධිකාරිය විසින් ගෙවන ලද වැටුප්, දීමනා හා අතිකාල අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 | නිලධාරීන් තිදෙනකු විසින් 2019, 2020 |

පිටුව 6 | 9

හා 2021 වර්ෂවල අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ඉන්ධන භාවිතාකර තිබුණු අතර ඒ සඳහා අධිකාරිය විසින් වැඩිපුර වැය කරන ලද රු. මිලියන 1.19 ක මුදල මෙතෙක් අයකරගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3. වෙනත් කරුණු

(අ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි සාමාන්‍ය වශයෙන් රු. මිලියන 242.70 ක මුදල් ශේෂයක් පසුගිය වර්ෂ 05 කට අධික කාලයක් තුල පවත්වාගෙන ගොස් තිබුණු අතර අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ඇති අතිරික්ත මුදල් උපායමාර්ගිකව කෙටිකාලීන ආයෝජනවල යෙදීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම මේ හේතුවෙන් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් ඉටුනොකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පනතේ 33 වගන්තියට අනුව කිසියම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක සුදුසුකම් ලත් පුද්ගලයකු ලෙස විදේශීය උපදේශකයකු සම්බන්ධ කරගැනීමට අවශ්‍ය යම් තැනැත්තකු මෙන්ම සෑම විදේශීය උපදේශකවරයෙකුම ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුතු වීමට පෙර අධිකාරියේ ලියාපදිංචි විය යුතු අතර එසේ නොවන්නේ නම් මෙම පනත යටතේ වරදකරුවකු වන්නේය. ලියාපදිංචිවීමේ ක්‍රියා පටිපාටි නියම කරනු ලබන පරිදි විය යුතු අතර මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් මෙතෙක් ක්‍රියාපටිපාටි සකස් කර නොතිබුණි.

පිටුව 7 | 9

(ii) පනතේ 43 සහ 44 වගන්ති පරිදි අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනකරුවන්, නිෂ්පාදකයන් හා උපාංග සපයන්නන්ගේ නාමාවලියක් හා දැනට තිබෙන බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණවල නාමාවලියක් පවත්වාගෙන යා යුතු වුවත් අධිකාරිය විසින් මෙතෙක් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

(iii) පනතේ 46 වගන්තිය පරිදි අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛණ එනම් ප්‍රසම්පාදන වැඩ (SBD – 01) හා ප්‍රසම්පාදන වැඩ සුළු (SBD – 03) කාලීනව අධිකාරියක් බවට පත්වීමත් සමඟ මෙතෙක් සංශෝධනය කර නොතිබුණි. තවද සම්මත ලංසු ලේඛණ 02 හා 04 යාවත්කාලීන කිරීමට අදාළ වැඩ කටයුතු සිදුකර 2021 ජූලි 27 දින භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව 2023 ඔක්තෝබර් 03 දින ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් පරීක්ෂණ මට්ටමින් වසරක කාලයක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව වසර 2 කට අධික කාලයක් මෙම ප්‍රමිත ලේඛන ක්‍රියාත්මක වීම ප්‍රමාද වී පැවතුණි. උපදේශන සේවා සම්බන්ධ ප්‍රමිති ලේඛන අවසන් වරට පිළියෙල කර තිබුණේ 2002 අගෝස්තු මස වන අතර එම දින සිට විගණිත දින වන 2024 අප්‍රේල් 30 දින දක්වා මෙම ලේඛන යාවත්කාලීන කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(iv) පනතේ 51 (2) වගන්තිය පරිදි කාර්මික ආරවුල් තීරනකරණ ක්‍රියා පටිපාටිය නියම කළ යුතු වුවද අධිකාරිය විසින් මේ දක්වා ආරවුල් තීරනකරණයට අදාල ක්‍රියාපටිපාටි සකස්කර නොතිබුණි.

(v) පනතේ 53 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වසර 20 කට නොඅඩු පළපුරුද්දක් සහිත 07 දෙනෙකුට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයක් පත්කර නොතිබුණි.

(vi) පනතේ 55 වන වගන්තියට අනුව පනතේ දක්වා ඇති තොරතුරු අවශ්‍ය පාර්ශවයන් වෙනුවෙන්, තොරතුරු ලබාදීම සඳහා තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර එහි කර්තව්‍ය හා කාර්යය පටිපාටි සහ කාර්යයසාධන ප්‍රමිති නියම කරනු ලැබිය යුතුය. එසේ වුවද අධිකාරිය විසින් තොරතුරු පද්ධතියක් මෙතෙක් සංවර්ධනය කර නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට අදාළ ප්‍රගතිය පරීක්ෂාවේ දී දේපළ සංවර්ධනකරුවන්, ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නන්, හරිත ගොඩනැගිලි සපයන්නන්, වැඩබිම් සුපරීක්ෂකවරුන් හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් ලියාපදිංචිය හා ආරවුල් තීරණකරණය පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම, ආදියෙහි කාර්යය සාධනය පහළ මට්ටමක පැවතුණි. තවද විදේශීය කොන්ත්‍රාත්කරුවන් හා ඩිජිටල්කරණය කරන ලද දත්ත පද්ධතියේ නිපුණ ශිල්පීන් ලියාපදිංචි කිරීම හා තාක්ෂණික විගණනයන් සිදු කිරීම, සියලු දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, සුපරීක්ෂන මට්ටමේ කළමනාකරුවන් සහ වෘත්තීය මට්ටමේ වෙනත් නිලධාරීන්

පුහුණු කිරීම, ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන්, ඉදිකිරීම් උපකරණ පිළිබඳව තරුණයින් පුහුණු කිරීම යන කාර්යයන් හි කාර්යය සාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) 2021 හා 2022 වර්ෂවල අධිකාරියේ මානව සම්පත් කළමනාකරණයේ කැපී පෙනෙන ගැටළුකාරී තත්ත්වයන් පැවතීම හේතුවෙන් නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම්, අනිවාර්ය නිවාඩු යැවීම්, ඉල්ලා අස්වීම්, අධිකාරියට විරුද්ධව නඩු පැවරීම්, වන්දි ගෙවීම් හේතුවෙන් නීති වියදම් රු.මිලියන 7.79 ක් දක්වා සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ධනය වී තිබුණි. තවද පුද්ගලික නඩු කටයුත්තක් (DMR/3067/2022 දරණ නඩුව) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව රු.මිලියන 0.34 ක නිතීඥ ගාස්තු මේ වන විට ගෙවා තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටුව 9 | 9